වාර්ෂික වාර්තාව

2017

NMRA
NATIONAL MEDICINES REGULATORY AUTHORITY

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA)

අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10.

පටුන

පිටු අංකය

සභාපතිතුමාගේ පණිවිඩය 4

ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය 5

අධ්‍යක්ෂක මණ්ඩලය 6

1 වෙනි පරිඡේදය - ආයතනික පැතිකඩ / විධායක සංක්ෂිප්තය 7

1.1 හැඳින්වීම 7

1.2 සංවිධානයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 8

1.2.1 සංවිධානයේ දැක්ම 8

1.2.2 සංවිධානයේ මෙහෙවර 8

1.2.3 සංවිධානයේ අරමුණු 9

1.3 ප්‍රධාන කාර්යයන් 10

1.4 පිරිස් ප්‍රතිපාදන 11

1.5 ජා.ඖ.නි.අ. යටතේ පවතින සේවා අංශ 12

1.5.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) 12

1.5.1.1 හැඳින්වීම 12

1.5.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ ආංශික ව්‍යුහය 13

1.5.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ ප්‍රධාන කාර්යයන් 13

1.5.2 ඖෂධ නියාමන අංශය 14

1.5.2.1 හැඳින්වීම 14

1.5.2.2 ඖෂධ නියාමන අංශයේ ආංශික ව්‍යුහය 14

1.5.2.3 ඖෂධ නියාමන අංශයේ කාර්යයන් 15

1.5.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය 15

1.5.3.1 හැඳින්වීම 16

1.5.3.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය 16

1.5.3.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ කාර්යයන් 16

පිටු අංකය

1.5.4 මූල්‍ය අංශය 17
1.5.4.1 හැඳින්වීම 17
1.5.4.2 ගිණුම් අංශයේ ආංශික ව්‍යුහය 17
1.5.4.3 මූල්‍ය අංශයේ කාර්යයන් 17
1.5.5 පරිපාලන අංශය 18
1.5.5.1 හැඳින්වීම 18
1.5.5.2 පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය 18
1.5.5.3 පරිපාලන අංශයේ කාර්යයන් 19
1.5.6 නීති අංශය 20
1.5.6.1 හැඳින්වීම 20
1.5.6.2 නීති අංශයේ සේවා අංශ සටහන 20
1.5.6.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන් 20
2 වෙනි පරිඡේදය - ප්‍රගමනය සහ දැක්ම 21
2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ (NMQAL) ප්‍රගතිය 21
2.1.1සේවා අංශයේ කාර්යසාධනය 22
2.2 ඖෂධ නියාමන අංශයේ ප්‍රගතිය 23
2.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ (IED) ප්‍රගතිය 23
2.4 මූල්‍ය අංශයේ ප්‍රගතිය 24
2.5 පරිපාලන අංශයේ ප්‍රගතිය 24
2.6 නීති අංශයේ ප්‍රගතිය 25
3 වෙනි පරිඡේදය - සමස්ථ මූල්‍ය කාර්යසාධනය 27
4 වෙනි පරිඡේදය - තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය (SDG) 69
5 වෙනි පරිඡේදය - මානව අංශ පැතිකඩ 71
5.1 සේවක සංඛ්‍යාව කළමනාකරණය කිරීම 71

කෙටි යෙදුම් ලැයිස්තුව

BPEC	සිමස්ථ නිෂ්පාදන ඇගයීමේ කමිටුව
CDD Act	විලවුන්ල උපකරණ හා ඖෂධ පනත
CFDI	ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක
DO	සංවර්ධන නිලධාරි
FDI	ආහාර හා ඖෂධ පරීක්ෂක
GDP	මනා බෙදාහැරීමේ පිළිවෙත්
GLP	මනා විද්‍යාගාර පිළිවෙත්
GMP	මනා නිෂ්පාදන කිරීමේ පිළිවෙත්
GPP	මනා ඖෂධ පිළිවෙත්
ICT	තොරතුරු සන්නිවේදන තාක්ෂණය
ID Card	හැඳුනුම්පත
IED	අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
ISO	ප්‍රමිතිකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානය
IT	තොරතුරු තාක්ෂණය
KKS	කාර්යාල කාර්ය සහායක
MA	කළමනාකාර සහකාර
MDED	වෛද්‍ය උපකරණ ඇගයීමේ කමිටුව
MED	ඖෂධ ඇගයීමේ කමිටුව
NDDCB	ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය
NDQAL	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය
NMQAL	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය
NMRA	ජාතික ඖෂධ නියාමන අධිකාරිය
SCOCT	සායනික පරීක්ෂණ උප කමිටුව
SDG	තිරසර සංවර්ධන අරමුණු
SSFFC	උප ප්‍රාමාණික/ව්‍යාජ/ව්‍යාජ ලෙස සලකුණු කරන ලද/ව්‍යාජනය කරන ලද/ව්‍යාජ ලෙස සාදන ලද
TRIPS	බුද්ධිමය දේපළ අයිතීන් පිළිබඳ වෙළඳමය ලක්ෂණ
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
WD	ආපසු ගැනීම
WH	රඳවා ගැනීම
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය

සභාපතිතුමාගේ පණිවිඩය

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ පවතින ස්වාධීන ආයතනයක් වන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටට පත් වෙමි. මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේ මහජනතාව විසින් පරිභෝජනය කරනු ලබන සියලුම ඖෂධවල, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන්වල තත්ත්වය, සුරක්ෂිතභාවය, සඵලත්වය සහ ඒවා මිළට ගැනීමේ හැකියාව ජාතික ඖෂධ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් පරීක්ෂා කිරීම ය.

රට තුළ පාවිච්චි කරනු ලබන සියලුම ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන්වල සියලුම කරුණු කාර්යක්ෂම, ඵලදායි සහ ඉහළ විනිවිදභාවයකින් යුතුව, විශේෂයෙන්ම අඩු මානව සම්පත් වැනි යටිතල පහසුකම් හිහකම වැනි බොහෝ අභියෝගවලට මුහුණ දෙමින් නියාමනය කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට හැකිවී ඇත. ජාතික වශයෙන් පිළිගත් ඖෂධ නිෂ්පාදන අවශ්‍ය කරනු ලබන ප්‍රමිතියට අනුකූලද යන්න නිශ්චය කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියට තාක්ෂණික සහාය ලබාදෙමින් ඒ සඳහා මූලිකත්වය දරණ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතුව තිබීම ආඩම්බරයට කරුණකි.

එසේම, 2015 වර්ෂයේදී ස්ථාපනය කරන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2017 වර්ෂය වනවිට මූල්‍ය වශයෙන් ස්ථාවර තත්ත්වයකට පත්වී මහා භාණ්ඩාගාරයෙන් කිසිදු ප්‍රතිපාදනයක් නොලබමින් ස්වාධීන ආයතනයක් බවට පත්වීමට හැකිවීම පිළිබඳව මම සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සමස්ථ කාර්යමණ්ඩලය සතුටට පත්වෙමු. ඖෂධ වෙළඳසැල්වලට සහ අදාල අනිකුත් නිෂ්පාදනවලට සහතික සහ බලපත්‍ර වඩාත් කාර්යක්ෂමව නිකුත් කිරීම පිණිස පද්ධති ජාලගත කිරීමේ මූලික පියවර මේ වනවිටත් ගෙන ඇත. දේශයේ සෞඛ්‍ය සේවා පද්ධතියේ තත්ත්වය සහ කාර්යක්ෂම බව මෙමගින් සෘජුවම වැඩිකරනු ඇති බවට මම විශ්වාස කරමි.

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ නායකත්වය යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියට සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගැනීමටත්, කාර්යමණ්ඩලයට මහ පෙන්වමින් මානව සම්පත ඥානවන්ත ලෙස වැඩිදියුණු කරමින්, සේවක තෘප්තිය තුළින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට මම කටයුතු කරමි.

2018 වර්ෂය අපගේ අධිකාරියට ඉතා සාර්ථක වසරක් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය අසිත ද සිල්වා

සභාපති

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය

දකුණු ආසියාවේ වේගයෙන් වර්ධනය වන ඖෂධ නියාමන නියෝජිතායතනවලින් එකක් වන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව එහි ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මම සතුටට පත් වෙමි. ආරම්භයේ සිටම අපගේ දැක්ම, මෙහෙවර සහ අරමුණු අප විසින් හඳුනාගෙන, අවබෝධ කරගෙන අපගේ කණ්ඩායමේ සාමාජිකයින් අතර බෙදා හදාගෙන කටයුතු කළ අතර, එය මෙම සියලු ප්‍රයත්නයන් පිටුපස තිබූ අමිල ශක්තිය වේ. අධිකාරියේ සියලු දෙනාම එක්ව ඉදිරි කටයුතු සඳහා මහ පෙන්වීමට පස් වසර සංයුක්ත සැලැස්මක් සකස් කර ඇත. අපගේ කාල්පනික නායකයින් වන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති මහාචාර්ය අසිත ද සිල්වා මහතා සහ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් අපව මෙහෙයවමින් මාර්ගෝපදේශකත්වය ලබා දෙති.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සිය නියාමන ක්‍රියාකාරකම් තුළින් රු.මි. 554 ක පිරිවැටුමක් වාර්තා කර ඇත. මෙම වර්ධනය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඖෂධ නියාමන ආයතනයක් ලෙස පිළිගැනීමට අවශ්‍ය කරනු ලබන ප්‍රධාන සුදුසුකමක් වන භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කිරීමකින් තොරව ස්වාධීන ආයතනයක් බවට පත්වීමට විශාල දායකත්වයක් ලබාදී ඇත.

අධිකාරියේ පිරිවැටුම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ වෛද්‍ය උපකරණ හා ඖෂධවල පිරිසැකසුම් ගාස්තු, ලියාපදිංචිය, නියැදි බලපත්‍ර, ආනයන බලපත්‍ර, නිෂ්පාදන බලපත්‍ර සහ තාවකාලික සහ මුළු ලියාපදිංචි ආදායම මත ය.

2017 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව අධිකාරිය විසින් රු.මි. 554ක අදාමක් වාර්තා කළේ ය. එසේම භාණ්ඩාගාර අයබද්දක් වශයෙන් රු.මි. 28 ක දායකත්වයක් සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ශුද්ධ ලාභයෙන් රු.මි.115 ක අදායම් බදු වශයෙන් මහාභාණ්ඩාගාරයට ලබාදීමට හැකිවීම පිළිබඳව මම ඉතා ආඩම්බර වෙමි. 2017 වර්ෂයේදී බදු අයකිරීමට පෙර රු.මි. 404 ක ලාභයක් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් වාර්තා කර ඇති අතර එය ඊළඟ වර්ෂයේදී අධිකාරියේ කාර්යසාධනය සහ වර්ධනය වැඩි කිරීමට හේතුවනු ඇත.

අපගේ ආයතනයේ අනාගතය සඳහා උපායමාර්ගික අරමුණ වන්නේ අධිකාරියේ ව්‍යවස්ථාමය වැඩ රාමුව ශක්තිමත් කිරීම බව අප විසින් හඳුනාගෙන ඇත. එකී අරමුණ සාක්ෂාත් කිරීමේදී තොරතුරු තාක්ෂණ පද්ධතිවල නවතම ක්‍රම භාවිතා කිරීම, මෙහෙයුම් ඵලදායිතාව වැඩිදියුණු කිරීම, මූල්‍ය කාර්යසාධනය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, සහ මානව ප්‍රාග්ධන පදනම සංවර්ධනය කිරීම මඟින් කටයුතු කිරීමට මම පූර්ණ වශයෙන් කැපවෙමි.



වෛද්‍ය කමල් ජයසිංහ

(MBBS, DFM, MSc-Med, Admin, MCMA, MBA, DIPPCA)

ප්‍රධාන විධායක නිලධාරි / අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩලය

1. මහාචාර්ය අසිත ද සිල්වා මහතා - සභාපති
2. වෛද්‍ය කමල් ජයසිංහ මහතා
3. මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා
4. මහාචාර්ය ආර්.එල්. ජයකොඩි මහතා
5. සී හේරත් මිය
6. ප්‍රියන්ත රත්නායක මහතා
7. වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර මහතා
8. වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු මහතා
9. ආචාර්ය කපිල රණසිංහ මහතා
10. වෛද්‍ය නිශ්ශංක ජයවර්ධන මහතා
11. ආචාර්ය ඩිලන්ති හේරත් මිය
12. වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහතා

1 වෙනි පරිච්ඡේදය

සංයුක්ත පැතිකඩ / විධායක සංෂිප්තය

1.1 හැඳින්වීම

සියලුම වර්ගයේ ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන නියාමනය කිරීම පිණිස ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇති එකම රජයේ නියෝජිතායතනය වන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරියයි (NMRA). එසේම මහජනතාවට දරාගත හැකි මිලකට රට තුළ අලෙවි කරනු ලබන සියලුම ඖෂධ නිෂ්පාදනවල ගුණාත්වය, සඵලත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම සම්බන්ධයෙන් වගකියන ආයතනයද වේ.

රට තුළ බෙදාහරිනු ලබන සියලුම වර්ගයේ ඖෂධ, වෛද්‍ය උපකරණ සහ විලවුන් නියාමනය කිරීමේ නීතිමය වැඩ රාමුව සපයා ඇත්තේ 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ හා ඖෂධ පනත (CDD Act) සහ 1984 විලවුන්, උපකරණ හා ඖෂධ රෙගුලාසි සහ ඉන් පසුව එකී පනතට හා රෙගුලාසිවලට 1980 සිට 2015 ජූලි මාසය දක්වා සිදුකරන ලද සංශෝධන මඟිනි. තවද, විලවුන්, උපකරණ හා ඖෂධ පනතින් ජාතික වෛද්‍ය ඖෂධ ප්‍රතිපත්තිය වැඩිදියුණු කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2007 වර්ෂයේදී ලබාදුනි. ඉහත පනත් ප්‍රතිස්ථාපනය කරමින් 2015 වර්ෂයේදී මෙම විෂයය වෙනුවෙන් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (NMRA Act) පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබීය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතට (NMRA Act) අනුව 2015 මාර්තු මාසයේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර එය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අර්ධ-ස්වායත්ත ආයතනයක් වශයෙන් 2015 ජූලි මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක විය. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (NMRA Act) යටතේ ස්වාධීන අධිකාරියක් වශයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කාර්යයන් සහ ශ්‍රී ලංකාවේ රෝගීන්ට ලබාදෙන සියලුම ඖෂධ නිෂ්පාදනවල සුරක්ෂිතභාවය ගුණාත්මකභාවය, සඵලත්වය සහ සුලභත්වය පිළිබඳව උපකල්පනය කරමින් තමාගේම තීරණ ගැනීමේ සහ එහි ක්‍රියාකාරකම් පාලනය කිරීමට මෙම ආයතනයට හැකිය.

ආරම්භයේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා සංවිධාන ව්‍යුහයක් නිසි පරිදි සටහන් කර තබා නැතත් එය පහත සඳහන් සේවා අංශවලින් සමන්විත බවට හඳුනාගත හැකි විය.

- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)
- ඖෂධ නියාමන අංශය
- අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
- මූල්‍ය අංශය
- පරිපාලන අංශය
- නීති අංශය

ඒ අනුව, තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහායවීම පිණිස කමිටු කිහිපයක් මෙම ආයතනයේ ඇත. එම කමිටුවලට ඖෂධ (MEC), වෛද්‍ය උපකරණ (MDEC), සීමාස්ථ නිෂ්පාදන (BPEC) සහ සායනික පරීක්ෂණ (SCOCT) ඇගයීමේ සහ සියලුම වෛද්‍ය උපකරණවල සුරක්ෂිතභාවය, ගුණාත්මකභාවය සහ සඵලත්වය සහතික කිරීම පිණිස වෙළඳපොල මිළ නියාමනය කරමින් ඒවා මහජනතාවට දරාගත

හැකි මිළකට ලබාගැනීමට හැකිවන පරිදි මිළ නියම කිරීමේ (Pricing Committe) වගකීම පැවරී ඇත. ඉහත කමිටුලට අමතරව, මහජනතාව සඳහා විවෘත වුනු අභියාචනා කමිටුවක් සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (NMRA Act) ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා උපදේශක කමිටුවක්ද මෙම ආයතනයේ ඇත.

තවද, නීතිමය අවශ්‍යතාවයන් ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරිය මනා නිෂ්පාදන පිළිවෙත් (GMP), මනා බෙදාහැරීමේ පිළිවෙත් (GDP) සහ මනා ඖෂධ පිළිවෙත් (GPP) යන පිළවෙත් සමඟ කටයුතු කරයි.

1.2 සංවිධානයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

1.2.1 සංවිධානයේ දැක්ම

"ගුණාත්මක බව සහතික කළ ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම."

1.2.2 සංවිධානයේ මෙහෙවර

"ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ආරක්ෂාව හා කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා නියාමන අධීක්ෂණ සහ සාධක පදනම් තීරණ රෝගීන්ගේ යහපත සඳහා ලබා දීම."

1.2.3 සංවිධානයේ අරමුණු

අ) ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවරදි තත්වයෙන් යුතු ඖෂධ, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු වෛද්‍ය උපකරණ සහ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම.

ආ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, නිෂ්පාදනය කිරීම, මිල නියම කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම.

(ඇ) ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ ආනයනය කිරීමට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදුකරන බවට තහවුරු කිරීම.

(ඈ) අත්‍යවශ්‍ය ඖෂධ සාධාරණ මිලකට පැවතීම සහතික කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම.

(ඉ) සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් හා පාරිභෝගිකයන් විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ආරක්ෂාකාරී ලෙස සහ විචාරශීලී ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවලට සම්බන්ධිත අදාළ නීති සඳහා උචිත සංශෝධන නිර්දේශ කිරීම.

(උ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පිලිබඳ මහජනතාව, සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් සහ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සියලු දෙනා දැනුවත් කිරීම.

(ඌ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අලෙවිකරණය නියාමනය කිරීම.

(එ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අලෙවිකරණය නියාමනය කිරීම.

(ඒ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය, ආරක්ෂාකාරී බව සහ අහිතකර ප්‍රතික්‍රියාවන් පිළිබඳව පශ්චාත් අලෙවිකරණ සමීක්ෂණ පැවැත්වීම.

(ඔ) ශ්‍රී ලංකාවේ සායනික පරීක්ෂණ පැවැත්වීමට අදාළ සියලු කටයුතු නියාමනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- නව ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම
- වෙළඳපොලේ දැනටමත් ලියාපදිංචි කර ඇති නිෂ්පාදන වල සංශෝධනය කිරීම් නියාමනය කිරීම
- හොඳ නිෂ්පාදන පිළිවෙත් අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම
- වෙළඳපොලේ සහ වෙළඳ ප්‍රචාරණ දැන්වීම්වල තිබෙන ඖෂධ නිෂ්පාදන සම්බන්ධයෙන් පරීක්ෂාකාරීවීම
- සායනික පරීක්ෂණ නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ඖෂධ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා හොඳ නිෂ්පාදන සහතික කිරීම
- හොඳ ඖෂධ පිළිවෙත් බලාත්මක කිරීම
- වෙළඳපොලේ තිබෙන ඖෂධ පරීක්ෂා කිරීම සහ නීතිය බලාත්මක කිරීම

1.4 පිරිස් ප්‍රතිපාදන

සේවක වර්ගීකරණය	තනතුර	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
	අධ්‍යක්ෂ	04	01	03
	අධ්‍යක්ෂ (මානව සම්පත්)	01	01 (වැඩ බලන)	01
	වෛද්‍ය නිලධාරි	04	-	04
	ගණකාධිකාරි	01	01	-
	අභ්‍යන්තර විගණක	01	-	01
	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	06	01	05
	සහකාර අධ්‍යක්ෂ/නියෝජ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	01	-	01
	පිරිවැය ගණකාධිකාරි	01	-	01
	නීති නිලධාරි	01	01	-
	ඖෂධ විශ්ලේෂක	13	06	-
තෘතීයික මට්ටම	පරිපාලන නිලධාරි	01	-	01
	පිරිවැය නිලධාරි	05	-	05
ද්විතියක මට්ටම	ඖෂධවේදී	70	53 (තාවකාලික/පදවියකට අනුයුක්ත කිරීමේ පදනම)	70
	සංවර්ධන නිලධාරීන්	10	06 (තාවකාලික පදනම)	10
	ඖෂධ පරීක්ෂක	20	03 (පදවියකට අනුයුක්ත කිරීමේ පදනම)	20
	තාක්ෂණික නිලධාරි (සිවිල්)	01	01 (තාවකාලික පදනම)	01
	ICT සහකාර	01	01 (පදවියකට අනුයුක්ත කිරීමේ පදනම)	-
	කළමනාකාර සහකාර	43 + (කොන්ත්‍රාත් පදනම 10)	10 (පදවිකට අනුයුක්ත කිරීම/තාවකාලික)	43
ප්‍රාථමික	රියදුරු	10	01 (ස්ථීර) 05 (තාවකාලික පදවියකට අනුයුක්ත)	09
	ජල නල කාර්මික	01	-	01
	විදුලි කාර්මික	01	-	01
	රසායනාගාර සහකාර	08	04 (තාවකාලික / පදවියකට අනුයුක්ත කිරීමේ පදනම)	08
	කාර්යාල කාර්ය සහායක	30	25	05
	එකතුව	**245**	**120**	**190**

1.5 ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින සේවා අංශ

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) මනා ක්‍රියාකාරිත්වය පිණිස එය පහත සඳහන් සේවා අංශවලින් සමන්විත වේ.

1. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (NMQAL)
2. ඖෂධ නියාමන අංශය
3. අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
4. මූල්‍ය අංශය
5. පරිපාලන අංශය
6. නීති අංශය

1.5.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)

1.5.1.1 හැඳින්වීම:

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (NDQAL), ශ්‍රී ලංකාව තුළ විලවුන්, උපකරණ හා ඖෂධ පරීක්ෂා කිරීම පිණිස පිහිටුවනු ලැබූ ජාතික විද්‍යාගාරය වේ. එය ශ්‍රී ලංකාව තුළ තිබෙන ඉහත නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සුරක්ෂිතභාවය සහ සඵලත්වය සහතික කිරීමේ දැක්ම සහිතව 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ හා ඖෂධ පනත යටතේ නෝවේජියානු උපදේශක මණ්ඩලයක් සහ NORAD අරමුල් ඇතිව පිහිටුවනු ලැබීය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පිහිටුවනු ලැබුවේ 2015 ජූලි මස 01 වෙනි දින ය. ඒ වනවිට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) නව අධිකාරිය පිහිටුවීමත් සමඟ 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබීය. එබැවින් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL), ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යටතේ ක්‍රියාත්මක වන අතර, එම විද්‍යාගාරය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) ලෙස නැවත නම් කරන ලදි.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රධාන සේවා අංශ වන්නේ රසායන ද්‍රව්‍ය, ක්ෂුද්‍රජීවී, සමුද්දේශ ප්‍රමිති සහ ක්‍රමාංකන සහ උපකරණ යන අංශයන් වේ. ඖෂධවල ගුණාත්මකභාවය, සුරක්ෂිත බව සහ සඵලත්වය තක්සේරු කිරීමේදී ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) විසින් සම්මත ඖෂධ සංග්‍රහයන්හි පරීක්ෂණ ක්‍රියාපටිපාටීන් සහ අනිකුත් පිළිගත් (වලංගු බවට පත්කරන ලද) පරීක්ෂණ ක්‍රියාපටිපාටීන් අනුගමනය කරනු ලබයි. අවශ්‍යතාවයක් වූ විට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) අතිරේක අනුමත වූ විශ්ලේෂකයකු ලෙස කටයුතු කරයි.

1.5.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ආංශික ව්‍යුහය



*Note: due to lack of qualified staff following amendments were made to approved organization Structure.

1. Biological tests are not carried out at present.
2. Staff of former Biological, Ref. Std &Calibration, Devices and Cytosis Division are merged temporarily under the name of 'Biological Division'. Accordingly, Chemical Tests, Physical Tests, Particulate Matter Tests are conducted by this division.

1.5.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රධාන කාර්යයන්

ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හා විලවුන් සම්බන්ධයෙන් තත්ත්ව සහතික කිරීමේ පද්ධතිය මෙහෙයවීමට අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) මගින් ලබාදෙයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) මූලික කාර්යය වන්නේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සුරක්ෂිත හා සඵල අවශ්‍යතා සමඟ අනුකූලතාව නිශ්චය කිරීමට අවශ්‍ය කරනු ලබන විද්‍යාගාර පරීක්ෂණ පැවැත්වීමයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) කාර්යයන් වන්නේ,

- දේශීයව නිෂ්පාදනය කරනු ලබන හා ආනයනික ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හා විලවුන් බෙදාහැරීමේ දාමයේ විවිධ ස්ථානවලදී විශ්ලේෂණය කිරීම (පූර්ව වෙළඳපොල හා පශ්චාත් වෙළඳපොල අදියරයන්). විශ්ලේෂණය සඳහා නියැදි ඉදිරිපත් කරනු ලබන්නේ ලියාපදිංචි නියැදි, පැමිණිලි නියැදි, ටෙන්ඩර් නියැදි, පූර්ව නැව්බඩු නියැදි, පූර්ව බෙදාහැරීමේ නියැදි සහ උසාවි නියැදි වශයෙනි. ඊට අමතරව, රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් සමීක්ෂණ නියැදි එක්රැස් කරනු ලබයි.

- අවශ්‍ය කරනු ලබන අවස්ථාවලදී ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචිය ඇගයීමේදී තාක්ෂණික උපදෙස් ලබාදීම.

- ජීඑම්පී (GMP) පරීක්ෂණවලට සහභාගිවීම.

- බාහිර තත්ත්ව සහතික කිරීම ඇගයීමේ වැඩසටහන්වලට (ප්‍රවීණතා පරීක්ෂණ) සහභාගිවීම.

- තත්ත්ව සහතික කිරීමේ පද්ධතිය සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විසින් තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වුවහොත් දේශීය හා විදේශීය විද්‍යාගාරවල සේවාවන් අවශ්‍ය වන අවස්ථාවලදී එම ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

1.5.2 ඖෂධ නියාමන අංශය

1.5.2.1 හැඳින්වීම

නිෂ්පාදනවල සුරක්ෂිත බව, සඵලත්වය, ගුණාත්මක බව හා ඒවායේ මිල පෙරදැරි කරගෙන රෝගීන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතා කරනු ලබන ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන නියාමනය කිරීමට අමතරව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) ඖෂධ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලා සහ දීපව්‍යාප්ත ඖෂධහල් නියාමනය කිරීමටද මැදිහත් වේ. ඖෂධ හා අදාල නිෂ්පාදනවලින් සිදුවන අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඖෂධබලපෑම් පිලිබඳ පසු විපරම (Pharmacovigilance) ද අදාළ අංශය මඟින් සිදුකරනු ලබයි.

1.5.2.2 ඖෂධ නියාමන අංශයේ ආංශික ව්‍යුහය



1.5.2.3 ඖෂධ නියාමන අංශයේ කාර්යයන්

- පහත දැක්වෙන කරුණුද ඇතුළුව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවලට අදාල සියලුම කාර්යයන් නියාමනය කිරීම;
- දේශීය සහ ජාත්‍යන්තරව කටයුතු කරන ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලා
- නව ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම, ලියාපදිංචි කිරීම හා ඒ සඳහා ආනයනික බලපත් නිකුත් කිරීම
- මිල නියාමනය කිරීම
- දිපව්‍යාප්ත ඖෂධහල් නියාමනය කිරීම
- ඖෂධ බලපෑම් පිළිබඳ පසු විපරම (Pharmacovigilance)

1.5.3 අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශය

1.5.3.1 හැඳින්වීම

අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශය, 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය තුළ ස්ථාපනය කරන ලද අංශයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ අධිකාරිය විසින් අවසර දෙනු ලබන සහ මෙහෙයවනු ලබන පරිදි ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනතේ දැක්වෙන ප්‍රතිපාදන විධිමත්ව ක්‍රියාත්මක කිරීමේදී පැනනඟින ගැටළු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සහ විමර්ශනය කිරීමයි. මෙම කාර්යයන් ඉටු කිරීම පිණිස ගරු ඇමතිතුමා විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිලධාරීන් වශයෙන් ජ්‍යෙෂ්ඨ ආහාර හා ඖෂධ පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු මෙම අංශයට පත්කර ඇත. මේ වනවිට මෙම අංශය මෙහෙයවනු ලබන්නේ ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක (CFDI) විසිනි.

ආහාර හා ඖෂධ පරීක්ෂණවරුන් අනිකුත් පුද්ගලයින් සමග ස්ථාවර සම්බන්ධතා පවත්වා ගැනීමට අවශ්‍ය කරනු ලබන රාජකාරි කටයුතු ඉටු කිරීමට වැඩිපුරම ක්ෂේත්‍රයේ සේවය කළ යුතු නිසා ඔවුන් ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් සලකනු ලැබේ.

1.5.3.2 අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය



1.5.3.3 අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශයේ කාර්යයන්

1. ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිළධාරීන් ලෙස කටයුතු කිරීම
2. පශ්චාත් වෙළඳපොල සමීක්ෂණ පැවැත්වීම
3. අවශ්‍ය වූ විටෙකදී විධිමත් සහ අවිධිමත් නියැදි ලබාගැනීම
4. බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන පරීක්ෂා කිරීම සහ එම ආයතන නිර්දේශ කිරීම
5. බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ ප්‍රවාහනය කරන වාහන පරීක්ෂා කිරීම සහ එම වාහන නිර්දේශ කිරීම
6. නිෂ්පාදන ආපසු කැඳවීමේ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම
7. SSFFC විසින් සහ හොර බඩු ජාවාරම්වලින් රඳවාගනු ලැබූ ඖෂධ නිෂ්පාදන සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම
8. පෞද්ගලික වෙළඳපොලේ රජයට අයත් ඖෂධ ලබාගැනීමේ හැකියාව විමර්ශනය කිරීම
9. අන්තරායකර ඖෂධ යෙදවුම් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම
10. අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම
11. පනත යටතේ සිදුකරනු ලැබූ උල්ලංඝණය කිරීම්වලට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට කටයුතු කිරීම
12. නීතිය බලාත්මක කිරීමේ අනිකුත් නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීම

1.5.4 මූල්‍ය අංශය

1.5.4.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) මූල්‍ය අංශයේ කටයුතු 2016.01.01 දින සිට ආරම්භ කරනු ලැබීය. 2016 වර්ෂයේදී සැලසුම් කළ පරිදි, ගණකාධිකාරිවරයෙකු බඳවාගෙන ඇති අතර, ගණකාධිකාරිද ඇතුළුව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සාමාජිකයින් තිදෙනෙකු, එක් අභ්‍යාසලාභියෙකු, කොන්ත්‍රාත් පදනම යටතේ එක් පුද්ගලයෙකු සහ එක් කාර්යාල කාර්ය සහායකයෙකු සමඟ සාමාජිකයින් හත් දෙනෙකු සහිතව සිය කටයුතු ආරම්භ කරන ලදි.

අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගත් පසු ඉදිරි වර්ෂවලදී මූල්‍ය අංශය විසින් සිය කාර්යය මනාව කරගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.5.4.2 ගිණුම් අංශයේ ආංශික ව්‍යුහය



1.5.4.3 මූල්‍ය අංශයේ කාර්යයන්

- ආදායම් ධාරා දහඅට මගින් සියලුම ආදායම් ලබා ගැනීම
- අවසන් ගිණුම් පිළියෙල කිරීම
- ඉදිරි වර්ෂය සඳහා අයවැය පිළියෙල කිරීම සහ ඒ සඳහා අනුමැතිය ලබාගැනීම.
- අධිකාරියේ එදිනෙදා ක්‍රියාකාරකම් සිදුකරගෙන යාමට අවශ්‍ය කරනු ලබන සියලුම සැපයුම් පවත්වාගෙන යාම
- සියලුම මුදල් පාලන කටයුතු
- ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්

1.5.5 පරිපාලන අංශය

1.5.5.1 හැඳින්වීම

පරිපාලන අංශයේ ප්‍රධානතම කාර්යය වන්නේ ඖෂධ නියාමන අංශයේ අනුමැතිය මත සියලුම වර්ගයේ ඖෂධ නිෂ්පාදන සැයුම්කරුවන් වෙත බලපත් සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමය. ඊට අමතරව, ගොඩනැගිලි නඩත්තුව, විදුලි භාණ්ඩ අලුත්වැඩියා කිරීම, වාහන කළමනාකරණය, වාහන සේවා කිරීම සහ අලුත්වැඩියා කිරීම, සියලුම වර්ගයේ බිල්පත් සහ ගෙවීම් සඳහා අනුමැතිය ලබාගැනීම, නිවාඩු සහ කාර්යමණ්ඩලයේ අනිකුත් විධිවිධානයන් පවත්වාගෙන යාම සහ කාර්යමණ්ඩලයේ සුභසාධනය ඉහල නැංවීමට අවශ්‍ය කටයුතු කිරීම මෙම අංශයට අයත්ය. පරිපාලන අංශය, අනිකුත් ආයතන සමග විධිමත් සන්නිවේදනයක් ස්ථාපනය කිරීම තුළින් සිය සේවාලාභීන් වෙත ඉහළ ගුණාත්මකභාවයකින් යුත් සේවාවක් ලබාදීමට උපකාරී වේ.

1.5.5.2 පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය



1.5.5.3 පරිපාලන අංශයේ කාර්යයන්

මෙම අංශය පිහිටුවනු ලබන්නේ විශේෂයෙන්ම ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවලට බලපත් සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම ඇතුළුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සියලුම පරිපාලන සහ නඩත්තු ක්‍රියාකාරකම් ආවරණය කිරීමට ය.

ඒ අනුව, පරිපාලන අංශය විසින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- ඖෂධ ලිපිගොනු ඇගයීමෙන් පසුව නිකුත් කරනු ලබන බලපත් (නිෂ්පාදන සහ ආනයන බලපත්), උපකරණ (නිෂ්පාදන සහ ආනයන බලපත්), නියැදි බලපත් සහ ලියාපදිංචි බලපත් නිකුත් කිරීම (ඖෂධ හා උපකරණ), ලියාපදිංචි සහතික සහ බලපත් යතුරුලියනය සහ ඇගයීම්පත් විද්‍යුත් තැපෑල ඔස්සේ යැවීම

- බලපත් සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම
- අධිකාරිය තුළ පිරිස් කළමනාකරණය
- කාර්යාල පරිශ්‍රය නඩත්තු කිරීමට අදාල සියලුම ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම
- උපයෝගිතා සේවා පවත්වාගෙන යාම
- අංශයට සම්බන්ධ අදාල වාර්තා පිළියෙල කිරීම
- වාහන සහ ප්‍රවාහන කළමනාකරණය
- කාර්යමණ්ඩලයේ නිවාඩු (රාජකාරි/දේශීය/විදේශීය) සම්බන්ධයෙන් ඇති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ස්ථිර සහ පුහුණු කාර්යමණ්ඩලයේ පැමිණීම සහතික කිරීම
- අධිකාරිය සඳහා බාහිර පාර්ශවයන් වෙතින් අවශ්‍ය කරනු ලබන ආරක්ෂක, පවිත්‍රතා, විදුලිය, උත්තෝලක සේවා, වායුසමීකරණ, ඡායා පිටපත් ආදී සේවාවන් ලබාගැනීම සහ සියලුම බිල්පත් ගෙවීම් සිදුකිරීම
- බාහිර සහ අභ්‍යන්තර ලේඛනාගාර අධීක්ෂණය කිරීම
- කාර්යමණ්ඩලය සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

1.5.6 නීති අංශය

1.5.6.1 හැඳින්වීම

2017 වර්ෂයේදී ස්ථාපනය කරන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථය තුළ ඇති ප්‍රධාන අංශවලින් එකක් ලෙස එහි නීති අංශය හැඳින්විය හැක. ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාද සහ විලවුන් ආනයනකරුවන්, නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, තොග සහ සිල්ලර වෙළෙඳුන් පාලනය කිරීමට අදාලව 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ නීති සම්පාදනය කිරීමේදී එම අධිකාරියේ නීති අංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

1.5.6.1 නීති අංශයේ ආංශික ව්‍යුහය



1.5.6.2 නීති අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන් සම්බන්ධයෙන් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනතට යෝග්‍ය සංශෝධන නිර්දේශ කිරීම
2. මතුවෙන මාර්ගෝපදේශ/රෙගුලාසි සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලාංකේය සංදර්භයට ගැළපෙන පරිදි යොදා ගැනීම
3. ශ්‍රී ලංකාව තුළ ඵලදායී සහ කාර්යක්ෂම නියාමන පද්ධතියක් සාක්ෂාත් කරගැනීම පිණිස වර්තමාන නීති පද්ධතිය වැඩිදියුණු/සංශෝධනය කිරීම
4. බලයලත් අලෙවි නියෝජිතයින් මාරු කිරීම.
5. නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් ලබාගැනීම හා නීති උපදෙස් සැපයීම
6. තොරතුරු දැනගැනීමේ පනතට අදාල ඉල්ලුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය

2 වෙනි පරිච්ඡේදය

ප්‍රගමනය හා දැක්ම

අර්ධ ස්වාධීන විශේෂී ඖෂධ නියාමන අධිකාරියක් ස්ථාපනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් වශයෙන් 2015 ජාතිකඖෂධනියාමන අධිකාරිය පනත මගින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පිහිටුවන ලදි. එහි වගකීම වන්නේ සුරක්ෂිත බව, සඵලත්වය, ගුණාත්මකභාවය සහ මිල කරණකොට ගෙන මහජනතාවගේ ලැදිකම් සාක්ෂාත් කිරීම පිණිස ඖෂධ නිෂ්පාදන (ඖෂධ, වෛද්‍ය උපකරණ හා විලවුන්) නියාමනය කිරීමය.

අධිකාරිය පිහිටුවනු ලැබූ මුල් වර්ෂවලදී එහි අරමුණු සාක්ෂාත් කිරීමේදී බොහෝ අඩුලුහුඩුකම් තිබුණි. එසේ තිබියදී වුවද රට වෙනුවෙන් විශිෂ්ඨ සේවයක් ලබාදීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට (NMRA) හැකිවිය.

2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රගතිය

පහත සඳහන් විද්‍යාගාර උපකරණ ලැබී ඇත. 1) Karl Fischer titrator, 2) Analytical balance, 3) pH meter, 4) Thermostatic water bath, 5) Laboratory shaker, 6) Water distiller, 7) Sterilizing oven, 8) Vacuum pressure pump (02 Nos), 9) Magnetic stirrer hot plate (02 Nos), 10) Ultrasonic bath and 11) Ageing oven.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති විසින් පත්කරන ලද උපදේශක කමිටුවේ කාර්යභාරය පහත පරිදිවේ;

අ) සිය අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) විසින් කළ හැකි සංවර්ධන හා වැඩිදියුණු කිරීම් පිළිබඳව උපදෙස් ලබාදීම.

ආ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) වර්තමානයේ මුහුණ දෙන ප්‍රශ්න හා ගැටළු සඳහා විසඳුම් යෝජනා කිරීම.

ඇ) සේවාවන්, ප්‍රසම්පාදන, මනා විද්‍යාගාර පිළිවෙත් (GLP) හා අදාල කරුණුවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම.

ඈ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) අනාගත දිශානතිය සම්බන්ධ පුහුණුව, බැඳීම් සංවර්ධනය පිළිබඳව උපදෙස් ලබාදීම.

ඉ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) කෙසේ කටයුතු කළ යුතුද යන්න ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) වෙත නිර්දේශ නිකුත් කිරීම.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) සඳහා නව ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) ස්ථාපනය කිරීමට, යෝජිත සංවිධාන සටහන හා නව විද්‍යාගාරයේ ප්‍රධාන පිරිසෙහි සුදුසුකම් පිළිබඳව ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් උපදේශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි.

SF ඖෂධ නිෂ්පාදන සමීක්ෂණය හා නිරීක්ෂණය පිළිබඳව 2016 ඔක්තෝබර් මස ඉන්දුනීසියාවේදී පවත්වන ලද ලෝක සෞඛ්‍ය සංවිධානයේ බද්ධ ප්‍රාදේශීය වැඩමුළුවට සහභාගි වෙමින් දිපිකා බුලත්සිංහල මෙනවිය විසින් USP නිලධාරීන්ගෙන් කරන ලද ඉල්ලීමකට අනුව ඇ.ඩො.15260 ක් වටිනා USP reference standards 26ක් (කුප්පි 46ක්) සහ USP complementary standard program විසින් නොමිලයේ ලබාදුන් USP NF 2017 මුද්‍රිත සංස්කරණය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) වෙත ලැබී ඇත.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) නිලධාරීන් දේශීය හා විදේශීය GMP පරීක්ෂණවලට සහභාගි වූහ.

රුහුණු, පේරාදෙණිය, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල, කොතලාවල ආරක්ෂක ඇකඩමියේ හා විවෘත විශ්වවිද්‍යාලයේ BPharm ආණ්ඩ BSC (pharmacy) උපාධි අපේක්ෂක සිසුන් පුහුණු කරන ලදි.

අනාගත සැලසුම්ථ

1) විවිධ විද්‍යාත්මක පසුබිම් සහ ඉහළ සුදුසුකම්ලත් කාර්යක්ෂම තාක්ෂණික කාර්යමණ්ඩයලක් හා අනිකුත් උපකාරක කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම.
2) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සංවිධාන ව්‍යුහයට ගැළපෙන පරිදි ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) සංවිධාන ව්‍යුහයක් පිළියෙල කිරීම.
3) පශ්චාත් වෙළඳපොල අදියරේදී නියැදි වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම නැවත ආරම්භ කිරීම.
4) දේශීය නියෝජිතයින් විසින් ලබාදෙන සහයෝගය ප්‍රමාණවත් නොවන නිසා නවීන හා ඉහළ සංවේදිතාවකින් යුත් විශ්ලේෂක උපකරණ නඩත්තු කිරීමේ ක්‍රියාපටිපාටියක් පිළියෙල කිරීම.
5) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සඳහා සියලුම විද්‍යාගාර අවශ්‍යතා (උපකරණ, රසායනික ද්‍රව්‍ය, ද්‍රාවණ, ප්‍රතිකාරක, මූලික හා අනිකුත් ප්‍රමිතීන්, වීදුරු භාණ්ඩ හා අනිකුත් උපාංග ආදිය) ප්‍රසම්පාදනය කිරීම පිණිස වෙනම ප්‍රසම්පාදන ඒකකයක් ස්ථාපනය කිරීම.
6) වඩාත් හොඳ සේවයක් ලබාදීම පිණිස අභ්‍යන්තර සන්නිවේදනය/ක්‍රියාපටිපාටීන්/සහයෝගය ශක්තිමත් කිරීම.
7) ISO 17025 පිළිගැනීම ලබා ගැනීම සඳහා සහ/හෝ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පූර්ව සුදුසුකම් තත්ත්වය ලබාගැනීම පිණිස විද්‍යාගාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

2.1.1 සේවා අංශයේ කාර්යසාධනය

2017 වර්ෂය තුළදී ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) විසින් නියැදි 496 ක් විශ්ලේෂණය කරන ලද අතර නියැදි/කාණ්ඩ 158 ක අසමත්කම් අනාවරණය කරගනු ලැබූ අතර ඒ අනුව එකී අසමත්කම් සඳහා නිර්දේශ නිකුත් කරන ලදි.

නියැදි වර්ගය	සමත් ගණන	අසමත්/ රඳවා ගැනීම/ ආපසු ගැනීම	දැනටමත් ආපසු ගෙන	සිදු නොකරන ලදි	එකතුව
පැමිණිලි	110	106	-	24	240
විධිමත්	31	2	-	23	56
අවිධිමත්	42	4	-	4	50
විද්‍යාගාර ඉල්ලීම්	2	1	-	-	3
සාමාන්‍ය ඉල්ලීම්	-	3	-	-	3
ලියාපදිංචි	114	32	-	5	151
රා.ඖ.නී.ස. ටෙන්ඩර්	9	3	-	-	12
වෙනත්	25	7	-	2	34
සමීක්ෂණ	5	-	-	-	5
	338	158	0	58	554

නිකුත් කරන ලද ගුණාත්මක සහතික ගණන	=	554-58
	=	496
නිකුත් කරන ලද අසමත් වාර්තා ගණන	=	158
2017 වර්ෂය තුළදී නිකුත් කරන ලද වාර්තාවලින්	=	32
තත්ත්ව අසමත් ප්‍රතිශතය (%)		

2.2 ඖෂධ නියාමන අංශයේ ප්‍රගතිය

අඩු මානව සම්පත් තිබියදී වුවද ඖෂධ නියාමන අංශයේ එදිනෙදා වැඩ කටයුතු උපරිම කාර්යක්ෂමතාවකින් සම්පූර්ණ කරනු ලැබේ. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) වගකීම් ඉටුකරනු පිණිස සියලුම නියාමන වැඩ බහුවිධ වැඩ කාර්යභාරයන් සහිත සියලුම නියාමක ඖෂධවේදීන් විසින් ඉටුකරනු ලබති. වර්ෂය සඳහා විවිධ වැඩ කාර්යභාරයන් සම්බන්ධයෙන් කණ්ඩායම් වැඩිදියුණු කිරීම පිණිස සාකච්ඡා කරන ලදි.

අනාගත සැලසුම්

1) අවශ්‍ය කරනු ලබන මානව සම්පත් (ඖෂධවේදීන්, කළමනාකාර සහාකාරවරුන්, කාර්යාල කාර්ය සහායකයින්) බඳවා ගැනීම
2) කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස සමාන වැඩ කාර්යභාරයන් සහිත කණ්ඩායම් ඇති කිරීමට අංශය, උප අංශවලට බෙදීම
3) අංශයේ අධි ක්‍රියාකාරිත්වය අඩු කිරීමට හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට විද්‍යුත් පද්ධති අවශ්‍යතා ඉටු කිරීම

2.3 අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශයේ (IED) ප්‍රගතිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) මූලික අරමුණ දිවයිනේ ඖෂධ නිෂ්පාදනවල සුරක්ෂිත බව, ගුණාත්මක බව හා සඵලත්වය සහතික කිරීම වන නිසා මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම පිණිස පරීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශය (I.E.D) ක්‍රියාකාරීව මැදිහත් වේ.

විවිධාකාරයේ උල්ලංඝනය කිරීම් හඳුනා ගැනීම හා නීතිමය පියවර ගැනීම මෙම ඒකකය විසින් කරනු ලබයි.

පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා මෙම අංශය විසින් නීතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම අංශයේ නිලධාරීන් නීතිය බලාත්මක කිරීමේ අනිකුත් නියෝජිතායතන (පොලීසිය/රේගුව/යුධ හමුදාව/ජාතික අන්තාරයකර ඖෂධ පාලන මණ්ඩලය (NDDCB) සමඟ සමීපව කටයුතු කරති.

2.4 මූල්‍ය අංශයේ ප්‍රගතිය

ගණකාධිකාරි බදවාගත් පසුව එදිනෙදා ක්‍රියාකාරකම්වල මනා හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය වෙනුවෙන් "Quick Book" ගිණුම් මෘදුකාංගය හඳුන්වා දෙන ලදි. එසේම නියාමන ගාස්තු ගණනය කිරීම සඳහා ඇ. ඩොලරයේ අගය පදනම් කරගෙන ගාස්තු වගුව හඳුන්වා දෙන ලදි.

අනාගත සැලසුම්

1) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විසින් ගිණුම් මෙහෙයවිය යුතු අතර අදායම සංවිධානයේ අරමුණු සාක්ෂා කරගැනීම පිණිස ඵලදායිව භාවිතා කළ යුතු ය.

2) අවශ්‍ය කරනු ලබන කාර්යමණ්ඩලය බඳවා ගැනීම.

2.5 පරිපාලන අංශයේ ප්‍රගතිය

එදිනෙදා පරිපාලන හා කළමනාකරණ රාජකාරි කටයුතු සිදුකරනු ලැබේ. කාර්යමණ්ඩලයේ සුභසාධනය පිළිබඳව සොයා බලයි. ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීමට සියලුම අංශවල මූලික රාජකාරි කටයුතු කිරීම සඳහා ඔවුන් වෙත පරිපාලන සහාය ලබා දෙයි.

ඊට අමතරව, පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යය වශයෙන් බලපත් හා ලියාපදිංචි සහතික පහත පරිදි නිකුත් කරනු ලැබේ (2017 ජූලි සිට දෙසැම්බර් දක්වා);

අංකය	සහතික වර්ගය	2017
1	ඖෂධ ලියාපදිංචිය	1476
2	ඖෂධ ආනයනය	3264
3	ඖෂධ නිෂ්පාදනය	111
4	ඖෂධ නියැදි	450
5	උපකරණ ලියාපදිංචිය	984
6	උපකරණ ආනයනය	1808
7	උපකරණ නිෂ්පාදනය	8
8	උපකරණ නියැදි	495
9	විලවුන් ලියාපදිංචිය	-
10	විලවුන් ආනයනය	-
11	විලවුන් නිෂ්පාදනය	-
12	විලවුන් නියැදි	-
13	සීමාස්ථ ලියාපදිංචිය	-
14	සීමාස්ථ ආනයනය	-
15	සීමාස්ථ නිෂ්පාදනය	-
16	සීමාස්ථ නියැදි	-
	එකතුව	**8596**

අනාගත සැලසුම්

1) ආයතනයේ සඵලත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස මානව සම්පත වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.

2) ආයතනික ව්‍යුහයේ කටයුතු අවසන් කළ යුතු අතර රජයේ මාර්ගෝපදේශවලට අනුව ඒ සඳහා අවශ්‍ය සංශෝධන සිදුකළ යුතු ය.

3) මානව සම්පත්, නෛතික කටයුතු හා තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා වෙනම අංශ ස්ථාපනය කළ යුතු ය.

2.6 නීති අංශයේ ප්‍රගතිය

- **මුළු ගොනු ගණන**

233	**ආරම්භ කර ඇත**
69	**අවසන් කර ඇත**
164	**විසඳීමට ඇත**

- **නියෝජිතායතන මාරු කිරීම්**

නොමිලේ	**17**
ගෙවීම් පදනම මත	**22**

- **නියෝජිතායතන මාරු කිරීමෙන් ලද මුළු ආදායම (2017.08.27 - 2017.12.31)** **<u>රු: 8,394,178.00</u>**

1. 2017 වර්ෂයේදී අංශයේ කාර්යසාධනය

නීති අංශයේ කාර්යසාධන සාරාංශය පහත දක්වා ඇත.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ 2017.01.01 සිට 2017.12.31 දක්වා කාලය තුළ නිකුත් කරන ලද රෙගුලාසි / ගැසැට්

අංකය	ගැසැට් අංකය හා දිනය	අන්තර්ගතය	සංලක්ෂය
01	**2006/45 - 2017.02.17**	වෛද්‍ය උපකරණ මිලකරන රෙගුලාසි	අන්තඃ අක්ෂීය කාච **38**
02	**2023/30 - 2017.06.14**	**ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාසථ නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ හා ඒ සඳහා බලපත් නිකුත් කිරීමේ ගාස්තු**	
03	**2030/47 - 2017.08.04**	වෛද්‍ය උපකරණ මිලකරන රෙගුලාසි	**Stent**
04	**2049/31 - 2017.12.14**	මිලකරන රෙගුලාසි මත උපරිම මිල සඳහා සංශෝධනය	**ඖෂධ නිෂ්පාදන වර්ග 48 කට එහා ගණනක් සඳහා 5% වැඩිකිරීමක්**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් ගොනු කර ඇති සහ තීන්දු කර නොමැති උසාවි නඩු (2017.12.31 දක්වා)

අංකය	LO අංකය	නඩුව	තත්ත්වය	ජා.ඖ.නි අධිකාරියේ තත්ත්වය
1	NMRA/LO/10/2017	මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ J93933 නඩුවේ මූලික විරෝධතා සම්බන්ධව නීති උපදෙස් පැතීම (MTS/FDI/LA/2011).	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**
2	NMRA/LO/11/2017	මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 70066 (LO/415/11)	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**
3	NMRA/LO/12/2017	මීගමුව මහේස්ත්‍රාත් අධිකරණය K 13644 (LO/321/13)	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**
4	NMRA/LO/13/2017	මතුගම මහේස්ත්‍රාත් අධිකරණය අංක 71118/11 (MTS/FDI/Legal/2014)	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**
5	NMRA/LO/15/2017	වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන අංක: 45379/09 දරණ නඩුව (LO/213/14)	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**
6	NMRA/LO/24/2017	S(FR) ඉල්ලුම්පත් අංක: 102/2016 එදිරිව ජා.ඖ.නි.අ., පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රිෂාද් බදියුදීන්, මනෝ ගනේෂන්, මහාචාර්ය දයා එදිරිසිංහ, AG ශ්‍රී ලංකාව තුළ ඖෂධ ලේබල් කිරීම සඳහා භාෂාවන්වල උචිත භාවිතය	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**
7	NMRA/LO/162/2017	නීති උපදෙස් ලබා ගැනීම ප්‍රතිශෝධන පෙත්සම අංක HDRA/118/09	**තීන්දු කර නොමැත**	**පැමිණිලිකරු**

ජාතික ඖෂධ නියාමන අධිකාරියට (NMRA) විරුද්ධව ගොනු කර ඇති සහ තීන්දු කර නොමැති උසාවි නඩු (2011.12.31 දක්වා)

අංකය	LO අංකය	නඩුව	තත්ත්වය	ජා.ඖ.නි අධිකාරියේ තත්ත්වය
1	NMRA/LO/121/2017	**බස්නාහිර පළාත් කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක: එච්.සී.සිවිල්(425/2017/mn (B.J. ඉන්ටර්නැෂනල් පුද්. සමාගම)**	**තීන්දු කර නොමැත**	**වගඋත්තරකරු**

3 වෙනි පරිච්ඡේදය

සමස්ථ මූල්‍ය කාර්යසාධනය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

2017 දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වූ වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශණ

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

	සටහන්	2016	2017
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත් සහ උපකරණ	2	25,668,931	5,528,972
ජංගම නොවන වත්කම් වල එකතුව		**25,668,931**	**5,528,972**
ජංගම වත්කම්			
තොගය		1,482,106	184,542
තැන්පතු සහ වෙනත් ලැබිය යුතු මුදල්	3	123,244	21,117,000
කෙටි කාලීන ආයෝජන		100,653,965	-
මුදල් සහ මුදල් හා සමාන දේ	4	631,736,823	79,624,667
ජංගම වත්කම් වල එකතුව		**734,023,138**	**100,926,209**
මුලු වත්කම් වල එකතුව		**759,692,069**	**106,455,181**
ස්කන්ධය සහ වගකීම්			
ස්කන්ධය			
සමුච්චිත අරමුදල		310,302,346	577,557,675
මුලු ස්කන්ධයේ එකතුව		**310,302,346**	**577,557,675**
ජංගම නොවන වගකීම්			
ප්‍රාග්ධන ප්‍රධානයන්	5	4,186,070	5,528,972
ගෙවිය යුතු බදු	6	1,845,328	266,519
මුලු ජංගම නොවන වගකීම් වල එකතුව		**6,031,398**	**5,795,491**
ජංගම වගකීම්			
ලැබුන අත්තිකාරම්	7	85,643,656	14,360,439
බදු සඳහා ප්‍රතිපාදන		116,598,042	2,723,519
ගෙවිය යුතු අගය මත එකතු කල බදු		105,462,594	16,198,667
ගෙවිය යුතු මුද්දර ගාස්තු		36,111,233	7,076,700
භාණ්ඩාගාර බදු පැනවීම් සඳහා ප්‍රතිපාදන		28,882,370	-
ගෙවිය යුතු ගාස්තු සහ වෙනත් ගෙවිය යුතු මුදල්		70,660,430	2,742,690
මුලු ජංගම වගකීම් වල එකතුව		**443,358,325**	**43,102,015**
මුලු වත්කම් සහ වගකීම් වල එකතුව		**759,692,069**	**106,455,181**

ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන වලට අමුනා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හිම කොටසක් වන්නේය .

ආර්.ඒ.සමරජීව
ගණකාධිකාරී

අධිකාරියෙහි සාමාජිකයන් මෙම මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. අධිකාරියෙහි සාමාජිකයන් වෙනුවෙන් අනුමත කොට අත්සන් කරමු.

මහාචාර්ය අසිත ද සිල්වා
සභාපති

වෛද්‍ය කමල් ජයසිංහ
ප්‍රකාශ විකාශක නිළධාරී

2019 මාර්තු 22
ජාතික ඖෂධ නියාමන අධිකාරිය
සවිස්තරාත්මක ආදායම් පිළිබඳ ප්‍රකාශය

	සටහන	2017	2018
ආදායම	9	554,495,401	114,410,560
රජයේ ප්‍රධානයන්	10	--	499,796,981
පොලී ආදායම්		653,966	-
වෙනත් ආදායම්		5,010,037	1,039,116
පරිපාලන වියදම්	11	(600,759,242)	(25,497,060)
වැටුප් සහ වේතන	12	(95,610,919)	(78,394,260)
වෙනත් වියදම්	13	(855,116)	(1,198,671)
ප්‍රාග්ධන ප්‍රධානය ක්‍රම ක්ෂය කිරීම		1,342,902	391,047
බදු වලට පෙර ලාභය		**404,277,030**	**60,547,713**
විර්ෂය සඳහා බදු	14	(115,453,332)	(2,990,038)
බදු වලට පසු ලාභය		**288,823,697**	**57,557,675**

ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන වලට අමුනා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හිම කොටසක් වන්නේය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
ස්කන්ධයේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය

2016 ජනවාරි 1 වන දිනට ශේෂය		
වර්ෂය සඳහා ලාභය		57,557,675
2016 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**57,557,675**
පසුගිය වර්ෂ සඳහා නිවරදි කිරීම	15	(7,196,656)
2016 දෙසැම්බර් 31 වන දිනට යලි ප්‍රකාශිත ශේෂය		**50,361,019**
වර්ෂය සඳහා ලාභය		288,823,697
භාණ්ඩාගාර බදු සඳහා ප්‍රතිපාදනය		(28,882,370)
2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**310,302,346**

ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන වලට අමුනා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හිම කොටසක් වන්නේය .

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මුදල් ප්‍රවාහය පිලිබඳ ප්‍රකාශය

බදු වලට පෙර ශුද්ධ ලාභය	404,277,030	60,547,713
පහත සඳහන් දේ සඳහා ගැලපුම්		
ක්ෂය	3,013,948	391,047
පසු ගිය වර්ෂ සඳහා නිවරදි කිරීමේ බලපෑම	48,846	-
ප්‍රාග්ධන ප්‍රධානයන්හි ක්‍රමක්ෂය	(1,342,902)	(391,047)
භාණ්ඩාගාර බදු සඳහා ප්‍රතිපාදන	(28,882,370)	-
පසු ගිය වර්ෂ සඳහා නිවරදි කිරීම්	(7,196,656)	-
බදු වලට පෙර මෙහෙයුම් වලින් ලත් ලාභය	369,917,895	60,547,713
කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස්වීම්		
තොගය	(1,297564)	(184,542)
තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දේවල්	20,993,756	(21,117,000)
අත්තිකාරම් ලැබීම්	71,283,217	14,360,439
ගෙවිය යුතු අගය මත එකතු කල බදු	89,263,927	16,198,667
ගෙවිය යුතු මුද්දර ගාස්තු	29,034,533	7,076,700
භාණ්ඩාගාර බදු සඳහා ප්‍රතිපාදනය	28,882,370	-
ගෙවිය යුතු වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු දේවල්	67,917,740	2,742,690
මෙහෙයුම් වලින් උත්පාදිත මුදල්	**675,995,874**	**79,624,667**
ආයෝජන කටයුතු වලින් වන මුදල් ප්‍රවාහය		
දේපොල, පිරියත් සහ උපකරන අත් පත් කර ගැනීම්	(23,202,753)	(5,920,019)
කෙටි කාලීන තැන්පතු වල ආයෝජන	(100,653,965)	-
ආයෝජන කටයුතු සඳහා භාවිත කල ශුද්ධ මුදල්	**(123,856,718)**	**(5,920,019)**
මූල්‍ය කටයුතු වලින් වන මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන වත්කම් සඳහා භාණ්ඩාගාරයේ දායකත්වය	-	5,920,019
මූල්‍ය කටයුතු සඳහා භාවිත කල ශුද්ධ මුදල්	**-**	**5,920,019**
මුදල් සහ මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩිවීම / අඩුවීම	552,139,156	79,624,667
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දේවල ශේෂය	79,624,667	-
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දේවල ශේෂය	**631,763,823**	**79,624,667**

ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන වලට අමුනා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හිම කොටසක් වන්නේය .

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

1. ගිණුම් ප්‍රතිපත්ති

1.1 වාර්තා කෙරෙන අස්ථිත්‍ය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (අධිකාරිය) වර්ෂ 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පණත යටතේ සංස්ථාපනය කොට 2015 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ. එය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා රාජ්‍ය අධිකාරියක් වන අතර කොළඹ 10, නෝරිස් කැනැල් පාරේ අංක 120 දරන ස්ථානයේ ස්ථාන ගත කොට ඇත්තේය. ජාතික ඖෂධ තත්ත්ව සහතික කරන රසායනාගාරයේ (NMQAL) බලතල සහ සියලු කාර්යයන් අධිකාරියට පවරා දී ඇත්තේය.

1.2 ප්‍රධාන ක්‍රියාකාරිකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

අධිකාරියෙහි අරමුණ වන්නේ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂිත සහ උසස් තත්ත්වයෙන් යුත් ඖෂධ, වෛද්‍ය උපකරන සහ සීමාස්ථ නිශ්පාදන දැරිය හැකි මිලකට ජනතාවට ලබා දෙන බවට සහතික වීමයි. අධිකාරරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරන සහ සීමාස්ථ නිශ්පාදන, සායනික පරීක්ෂන පැවැත්වීම සහ ඖෂධ වෙළඳ සැල් ලියාපදිංචි කිරීම සහ ඒවාට බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවා සම්බන්ධ නියාමන කටයුතු වල යෙදෙනු ලබන්නේය.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතාවය පිලිබඳ ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත්කොට ඇති ශ්‍රී ලංකා ගණකාධිකරන ප්‍රමිතයන්ට (SLFRS/LKAS) අනුකූලව සකස් කොට ඇත්තේය.

2.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වගකීම්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරන ලෙස ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධිකාරියෙහි සාමාජිකයන් වගකිව යුතු වේ.

2.3 **මිණුම් පදනම්**

මූල්‍ය ප්‍රකාශණයන්ට අමුනා ඇත්තාවූ සටහන් වල විස්තර කොට ඇති පරිදි වත්කම් සහ වගකීම් ඒවායේ සාදාරන අගයට පිලිගෙන තිබීම හැරුන කොට මෙම මූල්‍ය ප්‍රකාශණයන් සකස් කොට ඇත්තේ වෛතිහාසික පිරිවැය පදනම් කර ගනිමිනි.

මෙම මූල්‍ය ප්‍රකාශනයන් සකස් කොට ඇත්තේ දැකිය හැකි ඉදිරි කාලපරිච්ඡේදයක් දක්වා අධිකාරියට අඛණ්ඩ පැවැත්මක් ඇත්තේය යන පදනම මතය.

2.4 **ශ්‍රීතමය සහ ඉදිරිපත් කරනු ලබන්නාවූ මුදල් වර්ගය**

මූල්‍ය ප්‍රකාශයන් සකස් කොට ඇත්තේ අධිකාරියේ කාර්යයන් වලදී භාවිත කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයයන් භාවිතය

කුඩා සහ මධ්‍යම පරිමාන ව්‍යවසායයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථාකරන ප්‍රමිතයන් ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී යොදා ගන්නා ගිණුම් ප්‍රතිපත්ති සහ වාර්ථා කරන වත්කම් වල, වගකීම් වල සහ ආදායම් සහ වියදම් වල ප්‍රමාණයන්ට ට බලපාන විනිශ්චයයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් කිරීමට කළමණාකරනයට සිදුවේ. සත්‍ය ප්‍රතිපල එකී ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒවා සම්බන්ධ උපකල්පනයන් දිගින් දිගටම අඛණ්ඩව සමාලෝචනය කරනු ලබන්නේය. ඇස්තමේන්තු සමාලෝචනය කෙරන කාල සීමාවන් තුලදී අඛණ්ඩව ගිණුම් ඇස්තමේන්තු පිලිබඳ සංශෝධනයන් හඳුනාගන්නා අතර ඒවා ඕනෑම අනාගත කාලපරිච්ඡේදයකට බලපානු ලබන්නේය.

මූල්‍ය ප්‍රකාශනයන් හි දක්වා ඇති වටිනාකම් ප්‍රමාණයන් මත වඩාත් වැදගත් බලපෑමක් කරනු ලබන ගිණුම් ප්‍රතිපත්ති යොදා ගැනීමේදී භාවිත කරන මිණුම් දඬු සහ විනිශ්චයයන්ට පහත සඳහන් දේ ඇතුලත් වේ.

විශ්‍රාම සුභසාධන බැඳියාවන්
ක්ෂය කල හැකි වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

2.6 ප්‍රමාණවත් බව සහ සමාහරනය

සෑම එක සමාන ප්‍රමාණවත් කමින් යුත් අයිතමයන් මූල්‍ය ප්‍රකාශයන්හි වෙනමම ව ඉදිරිපත් කොට ඇත. එක හා සමාන නොවන ස්වභාවයේ අයිතමයන් හෝ ශ්‍රිතයන් ඒවා ප්‍රමානවත් තරම් වැදගත් කමක් නොගන්නේ නම් හැර වෙනමම දක්වා ඇත.

2.7 සන්සන්දනාත්මක තොරතුරු

වර්ථමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලට සනාථ කිරීම අවශ්‍ය වන තාක් දුරට සන්සන්දනාත්මක තොරතුරු යලි වර්ගීකරනය කොට ඇත්තේය.

3. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති වර්ෂය තුලදී එකාකාරී ලෙසට භාවිත කොට ඇත්තේය.

3.1 පිරියත් සහ උපකරන

3.1.1 හඳුනා ගැනීම සහ මැනීම

පිරියත් සහ උපකරන අයිතමයන් ගණනය කොට දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන අලාභ අඩු කිරීමෙන් පසුව වේ.

සියලුම දේපල, පිරියත් සහ උපකරණ අයිතමයන් ආරම්භක වශයෙන් ගණන් ගෙන ඇත්තේ පිරිවැයටය. දේපල, පිරියත් සහ උපකරණ වල එම වත්කම අත්පත් කර ගැනීම උදෙසා සෘජුව තෝරා වෙන් කල හැකි වියදම් ද අඩංගු වේ. තමන් විසින්ම ඉදිකල වත්කම් වල අඩංගු කොට ඇත්තේ එම වත්කම අදහස් කරන ලද පරිදි භාවිතයට ගැනීම තෙක් සෘජුව ඒ සඳහා වෙන් කල හැකි ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ වෙනත් සෘජු පිරිවැය යනාදියයි. සම්බන්ධිත උපකරනයේ ක්‍රියාකාරිත්වයට අදාල එහිම කොටසක් වන මිලදී ගත් මෘදුකාංගයන් එම උපකරනයේම කොටසක් ලෙසට ප්‍රාග්ධන ගත කරනු ලබයි.

පිරියතක හෝ උපකරණයක කොටසක් සඳහා වෙනම ම වූ ප්‍රයෝජනයට ගත හැකි ජීව කාලයක් ඇති විට ඒවා වෙනම ම (ප්‍රධාන සංරචකයක් ලෙස) පිරියත හෝ උපකරණ අයිතමයක් ලෙසට හිණුම් ගත කරනු ලබන්නේය.

3.1.2 පසුව වන පිරිවැය

පිරියතක හෝ උපකරණයක කොටසක් වන අයිතමයක ප්‍රතිස්ථාපන පිරිවැය එම අයිතමයේ ඉදිරියට ගෙන යන වටිනාකමක් ලෙස හඳුනා ගනු ලබන්නේ එම කොටස තුල අන්තර්ගත අනාගත ආර්ථික වාසි අධිකාරියට ප්‍රවාහය වීමට ඉඩ තිබිය හැකි වීම මත සහ එහි පිරිවැය විශ්වාසවන්ත ලෙස මිනිය හැකි වන්නේ නම් පමනි. ප්‍රතිස්ථාපන කරන ලද කොටසේ ඉදිරියට ගෙන යන වටිනාකම වත්කමේ පිරිවැය යටතේ හඳුනා නොගන්නවා ඇත.

පිරියතක හෝ උපකරණයක එදිනෙදා සේවා කිරීමේ පිරිවැය විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දී දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලබන්නේය.

3.1..3 ක්ෂය කිරීම්

ක්ෂය කිරීම් විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනු ලබන්නේ පිරියත් සහ උපකරන අයිතමයන්ගේ එක් එක් කොටසක ඇස්තමේන්තු ත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය තුල සරල රේඛීය ක්ෂය කිරීමේ පදනම මත වේ.

වර්තමාන සහ සසන්දනාත්මක කාල පරිච්ඡේදයන් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාලයන් මෙසේය.

ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 05
කාර්යාල උපකරන	වර්ෂ 05
පරිගණක උපකරන	වර්ෂ 04
ගොනු ගබඩාව	වර්ෂ 05
රසායනාගාර උපකරණ	වර්ෂ 05
පරිගණක මෘදුකාංග	වර්ෂ 04

වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතය සඳහා ලැබෙන අවස්තාවේ සිට විකිනීම් සඳහා තබාගනු ලබන්නේ යයි වර්ගී කරනය කරනු ලබන දින හෝ වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කරන දින යන දින දෙකෙන් ආසන්නතම දිනය දක්ව වේ. ක්ෂය කිරීමේ ක්‍රම, ප්‍රයෝජනවත් ජීවිත කාල සහ අවශේෂ වටිනාකම් වාර්තා කරන දිනට යලි තක්සේරු කරනු ලැබේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්
දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

3.1.4. හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

වත්කමක , පිරියතක හෝ උපකරණයක ඉදිරියට ගෙන යන වටිනාකම හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම කරනු ලබන්නේ එය බැහැර කරන විට හෝ එය භාවිතයෙන් ඉවත් කිරීම හෝ බැහැර කිරීම හේතුවෙන් අනාගත අර්ථික වාසි බලාපොරොතු නොවන විටයි. හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන වත්කමකින්, පිරියතකින් හෝ උපකරණයකින් ලබන්නාවූ ලාභය හෝ පාඩුව අයිතමය හඳුනා ගැනීමෙන් ඉවත් කරන විට ලාභයෙහි හෝ පාඩුවේ අඩංගු කරනු ලබන්නේය.

3.2 **මූල්‍ය සාධන පත්‍ර**

මූල්‍ය සාධන පත්‍ර යනු එක් අස්තිත්‍යයකට මූල්‍යමය වත්කමක් සහ තවත් අස්තිත්‍යයකට මූල්‍යමය වගකීමක් ඇති කරවන ඕනෑම ගිවිසුමක් හෝ වෙනත් අස්තිත්‍යයක ස්කන්ධ සාධන පත්‍රයක් වේ.

ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගී කරනය කරන අතර පසුව ඒවා වෙනත් විස්තරාත්මක ආදායම් (OCI) හරහා වන සාධාරන අගය මත සහ ලාභ හෝ අලාභ හරහා සාධාරන අගය මත ක්‍රම ක්ෂය පිරිවැයට මනිනු ලබයි.

3.2.1 **ආරම්භයේදී හඳුනා ගැනීම් සහ පසුව මැනීම්**

පසුව මැනීමේ කාර්ය සඳහා මූල්‍ය වත්කම් කාන්ඩ හතරකට වර්ග කරනු ලැබේ

i. ක්‍රම ක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය සාධණ පත්‍ර)
ii. මූල්‍ය වත්කම් සාදාරන අගයට වෙනත් විස්තරාත්මක ආදායම් (OCI) හරහා ප්‍රතිවර්ත්‍ර කරනය සමග සමුච්චිත වාසි හෝ පාඩු සහිතව (ණය සාධණ පත්‍ර)
iii. සාධාරන අගයට ආරෝපිත මූල්‍ය වත්කම් වෙනත් විස්තරාත්මක ආදායම් (OCI) හරහා ප්‍රතිවර්ත්‍ර කරනය සමග සමුච්චිත වාසි හෝ පාඩු සහිතව හඳුනා ගැනීමෙන් ඉවත් කරන අවස්තාවේදී (ස්කන්ධ සාධණ පත්‍ර)
iv. ලාභ හෝ පාඩු හරහා මූල්‍ය වත්කම් සාදාරන අගයට

3.2.3 මූල්‍ය වත්කම් ක්‍රම ක්ෂය පිරිවැයට (ණය සාධණ පත්‍ර)

මෙම වර්ගය අධිකාරියට ඉතා මත් අදාල වේ. පහත සඳහන් කොන්දේසි දෙකම ඉටු වන්නේ නම් සමූහය විසින් මූල්‍ය වත්කම් මනිනු ලබන්නේ ක්‍රම ක්ෂය පිරිවැයටය මූල්‍ය වත්කම් ව්‍යාපාරික මොඩලය තුල රඳවා තබා ගන්නේ වත්කම් රඳවා තබා ගැනීම මගින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම අරමුණු කොට ගෙන සහ මූලික වශයෙන් ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය මත මූලික මුදල සහ පොලිය ගෙවීම සඳහාම පමනක් වන නියමිත දිනට කල යුතු මුදල් ප්‍රවාහය පැනනගින්නාවූ මූල්‍ය වත්කම් මත වන ගිවිසුම් ගත කොන්දේසි ක්‍රම ක්ෂය පිරිවැයට වන මූල්‍ය වත්කම් පසුව මනිනු ලබන්නේ ඵලදායක පොලී ක්‍රමය යොදා ගනිමින් වන අතර ඒවා හානි කරන අලාභයන්ට යටත් වේ. වත්කම් හඳුනා ගැනීමෙන් ඉවත් කරන විට, නවීකරනය කරන විට හෝ හානියට පත්වූ විට වාසිය හෝ පාඩුව ලාභ අලාභ යටතේ හඳුනාගනු ලබයි.

3.2.4 මූල්‍ය වත්කම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

මූලික වශයෙන් මූල්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ වත්කමින් මුදල් ප්‍රවාහය වීමේ අයිතිය කල් ඉකුත් වී ගිය විට වේ.

3.3 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ඇස්තමේන්තු ගත උපලබ්ධි වටිනාකම් වලට වේ.

3.4 මුදල් සහ මුදල් හා සමාන දේ

මුදල් සහ මුදල් හා සමාන දේ වල අඩංගු වන්නේ මුදල් ශේෂයන් සහ කැඳවුම් තැන්පතු සඳහා වේ. ඉල්ලූ විට ආපසු ගෙවිය යුතු බැංකු අයිරාවන් අධිකාරියේ මුදල් කළමණාකරනයේ ප්‍රධාන තම කොටසක් වන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශ කාර්යයන් සඳහා ඒවා මුදල් සහ මුදල් හා සමාන දේ වල් එහි සංරචකයක් ලෙසට අඩංගු කොට ඇත්තේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශ කිසිවක් ඇත්තේ නම් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙල කරනු ලබන්නේ 07 වන වගන්තියේ දක්වා ඇති පරිදි වක්‍ර ක්‍රමයට වේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

3.5 **තොගය**

තොගය හඳුනාගන් ලබන්නේ "පළමුව ලැබුන පළමුව පිටවන" පදනම මත යල් පිනූ සහ සෙමින් චලනය වන දේ සඳහා නිසි ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අණතුරුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය යන දෙකින් අඩු එක මත වේ.

3.6 **වගකීම් සහ වෙන්කිරීම්**

මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශණයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරනය කර ඇති වගකීම් වූ කලී වාර්තා කරන දිනයට වර්ෂයක් ඇතුලත ගෙවීමට සිදුවන හෝ ඉල්ලා සිටි විට ගෙවිය යුතු ගෙවීම් වේ.

සියලූම දන්නා කියන වගකීම් ගිණුම් ගත කොට ඇති අතර මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීමේදී ඒවා සැලකිලිලට ගෙන ඇත.

3.6.1. **වෙන්කිරීම්**

පසු ගිය සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරියට වර්තමාන නෛතික හෝ වැඩදායක බැඳීමක් නිරවුල් කිරිම සඳහා ආර්ථික වාසි බැහැරට ප්‍රවාහය වීම කල යුතුව ඇති විට සහ බැඳීමක් විශ්වාසදායක ලෙස ඇස්තමේන්ත ගත කල හැකි වන විට වෙන් කිරිමක් හඳුනාගත හැකි වන්නේය.

3.7 **සේවක සුභසාධනය**

3.7.1. **අර්ථකථනය කල දායකත්ව සැලසුම්**

අර්ථකථනය කල දායකත්ව සැලසුම් යනු අස්තිත්‍ය විසින් ස්ථාවර දායක මුදලක් පශ්චාත් සේවක සුභසාධන සැලසුම යටතේ වෙනම ම වූ අස්තිත්‍යයකට ගෙවීම සහ තවදුරටත් ගෙවීම් කිරිමට නෛතික හෝ වැඩදායක බැඳීමක් නොමැති වීම වේ. අර්ථකථනය කල දායකත්ව විශ්‍රාම සැලසුම් සඳහා දායක මුදල් ගෙවීමේ බැඳියාව සේවක සුභසාධන වියදමක් ලෙස විස්තරාත්මක ආදායම් ප්‍රකාශණයේ හඳුනා ගනු ලබන්නේ එවා ගෙවීමට ඇති විට වේ. කලින් ගෙවන ලද දායක

මුදල් වත්කමක් වශයෙන් හඳුනාගනු ලබන්නේ එහි මුදල් වශයෙන් ආපසු ගෙවන ලද ප්‍රමාණයට හෝ අනාගත ගෙවීම් වලින් අඩු කිරීම් පවතින විට පමනි.

අධිකාරිය විසින් සේවකයන්ගේ දළ පාර්ශ්වීකයන්ගෙන් පිලිවෙලින් 12% ක් සහ 3% ක් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වනු ලබන්නේය.

3.7.2 අර්ථකථනය කල සුභසාධන සැලසුම්

අර්ථකථනය කල සුභසාධන සැලසුම් යනු අර්ථකථනය කල දායකත්ව සැලසුම් වලට වඩා වෙනස් පශ්චාත් සේවක සුභසාධන සැලසුමකි. අර්ථකථනය කල සුභසාධන සැලසුම් සම්බන්ධයෙන් වූ කලී මූල්‍ය ප්‍රකාශණයන්හි වගකීම් හඳුනාගනු ලබන්නේ වාර්ථා කරන දිනට අර්ථකථනය කල සුභසාධන බැඳීම් වල වර්ථමාන අගයට වේ.

LKAS 19 න් නිර්දේශිත පරිදි අර්ථකථනය කල සුභසාධන බැඳීම් ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය මගින් සුදුසුකම් ලත් ආයු- ගණකවරයකු විසිනි. අර්ථකථනය කල සුභසාධන බැඳීම් වල වර්තමාන අගය තීරණය කරනු ලබන්නේ සුභසාධන හිමිකම් ගෙවනු ලබන මුදල් වර්ගය පදනම් කොටගත් සහ වගකීමේ ප්‍රමාණය මත කල් පිරීමේ ආසන්නතම තාවය අනුව වන අනාගත මුදල් ප්‍රවාහය පදනම් කරගත් පොලී අනුපාතය මත වට්ටම් කිරීමෙනි. 1983 අංක 12 දරණ පාරිතෝෂික පණතට අනුකූල වන ලෙසින් වර්ෂ පහක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම පාරිතෝෂිකය සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි වෙන් කිරීම් කරනු ලබන්නේය.

3.8 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේවල්

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේවල් ඒවායේ පිරිවැයට ප්‍රකාශයට පත් කරනු ලබන්නේය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්
දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

3.9 **ආදායම්**

3.9.1 සේවාවන්

සපයන ලද සේවාවන් වෙනුවෙන් වන ආදායම ආදායම් ප්‍රකාශයන්හි හඳුනා ගනු ලබන්නේ වාර්තා කරනු ලබන දිනට තිබෙන්නාවූ ගණුදෙනු චක්‍රය අවසන්වීම සහ දෙනු ලබන අවදානම් සහ ප්‍රතිලාභයන් මත වේ.

3.9.2 **පොළී ආදායම්**

පොළී ආදායම එවා ලැබිය යතු වන විටම ආදායම් ප්‍රකාශයන්හි හඳුනා ගනු ලබයි. දිගු කාලීන මූල්‍ය සාධන පත්‍රවලින් ලැබෙන පොළී ආදායම් වාර්ථා කරනු ලබන්නේ සඵලදායක පොළී අනුපාතයන් මත වේ (EIR).

3.10 **රජයේ ප්‍රධානයන්**

රජයේ ප්‍රධානයන් යනු අස්තිත්‍වයට සම්පත් මාරු කිරීමේ ස්වරූපයෙන් රජය විසින් දෙනු ලබන සහාය යන් වේ.

රජයේ ප්‍රධානයන් වන්නේ වත්කම් වල සාධාරන අගයට වන මූල්‍යමය නොවන ප්‍රධානයන් වන අත ඒවා මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කල යුත්තේ ප්‍රධානය, විලම්බිත ආදායම් හෝ වත්කමේ ඉදිරියට ගෙන යන වටිනාකම ලබාගැනීම සඳහා ප්‍රධානයේ වටිනාකම අඩු කිරීමෙන් පසුවයි.

3.11 **වියදම්**

ව්‍යාපාරය ඉදිරියට පවත්වා ගෙනයාම සඳහා දරන ලද සියලුම වියදම් වර්ෂයේ ලාභය ගෙන හැර දැක්වීම සඳහා විස්තරාත්මක ආදායම් ගිනුමට අය කරන ලදී.

3.12 **විදේශ මුදල් වලින් කරන ලද ගනු දෙණු**

විදේශ මුදල් භාවිතයෙන් කරන ලද ගනු දෙණු එම ගණු දෙනුව සිදුවූ දින යටතේ හඳුනා ගැනීමට සුදුසුකම් ලබන පලමු අවස්ථාවේදීම එහි කාර්ය සිදුවූ මුදල් වර්ගයටම අදාල වන ස්ථානීය රේට් ප්‍රමාණයෙන්ම වාර්ථා ගත කරනු ලබන්නේය.

විදේශ මුදලින් බලපත්වන්නාවූ මුදල්මය වත්කම් සහ වගකීම් කාර්ය සිදුවූ මුදල් වර්ගයටම අදාල වන වාර්ථා කරන දිනට වන ස්ථානීය රේට් ප්‍රමාණයෙන්ම පරිවර්තනය කරනු ලබන්නේය.

3.13 බදු වියදම්

ආදායම් බදු වියදම් වල අඩංගු වන්නේ වර්ථමාන විලම්බිත බදු වේ. විස්තරාත්මක ආදායම් ප්‍රකාශයන්හි බදු වියදම හඳුනා ගනු ලබන්නේ ස්කන්ධය යටතේ හඳුනා ගන්නා ස්කන්ධයට සෘජුවම සම්බන්ධ වන ප්‍රමාණයන් හැර තිබෙන්නා වූ ආදායම මතයි.

3.13.1 වර්තමාන බදු

වර්තමාන බදු යනු වාර්ථා කරන දිනට පණවා ඇත්තා වූ හෝ ස්ථාවර පදනමකින් පණවා ඇත්තා වූ බදු රේට් ප්‍රමාණයන් යොදා ගනිමින් කාලපරිච්ඡේදය සඳහා බදු ගෙවිය යුතු ආදායම මත ගෙවිය යුතු බදු ප්‍රමාණය සහ පෙර කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැලපීමක් වන්නේය.

අධිකාරියේ බදු වගකීම ගණනය කරනු ලබන්නේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පණතේ ප්‍රතිපාදන වලට අනුකූලවය.

3.13.2 විලම්බනය කල බදු බැර

විලම්බනය කල බදු බැර හඳුනා ගනු ලබන්නේ වාර්තාකරනය සඳහා යොදාගන්නා වත්කමක සහ වගකීමක ඉදිරියට ගෙන යන වටිනාකම සහ බදු කරන කාර්යයන් සඳහා භාවිත කරන වටිනාකම් අතර වෙනස සඳහා තාවකාලික වශයෙන් වෙන් කිරීමක් කරනු ලබන ලෙසටයි.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්
දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

පහත සඳහන් තාවකාලික වෙනස් කම් සඳහා විලම්භනය කල බදු බැර හඳුනා ගනු නොලැබේ: ව්‍යාපාරික සංයුක්තයකට අයත් නැති ගණුදෙනුවක වත්කමක් හෝ වගකීමක් ලෙස ආරම්භයේදී හඳුනා ගන්නා සහ ගිණුම් ගත හෝ බදු ගෙවිය යුතු ලාභයට හෝ අලාභයකට බලපෑමක් නොවන ගණුදෙනුවක්.

විලම්භනය කල බදු බැර වත්කමක් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස උපයෝගී කර ගැනීම සඳහා අනාගත බදු ගෙවීය යුතු ලාභයක් පැවතිය හැකි වේ යයි යන ප්‍රමාණය දක්වා පමනි. විලම්භනය කල බදු බැර වත්කම් එක් එක් වාර්තා කරන දිනයකදී සමාලෝචනය කරන අතර අදාල බදු වාසිය පැහැදේ යයි යන්න තවදුරටත් විය නොහැකි විට එම ප්‍රමාණයෙන් එය අඩු කරනු ඇත.

3.14 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කොට ඇත්තේ LKAS 7 හි දැක්වෙන " මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ " ඇත්තා වූ "වක්‍ර ක්‍රමය" යොදා ගනිමිනි.

මුදල් ප්‍රවාහ ලේඛණයේ ඉදිරිපත් කිරීමේ කාර්යයන් සඳහා ගෙවන ලද පොලී මුදල් වර්ගීකරනය කොට දක්වා ඇත්තේ මෙහෙයුම් මුදල් ප්‍රවාහය ලෙසටත් , ලද පොලී මුදල් වර්ගීකරනය කොට දක්වා ඇත්තේ ආයෝජන මුදල් ප්‍රවාහය ලෙසටත් වන අතර ගෙවන ලද භාණ්ඩාගාර බදු වර්ගීකරනය කොට දක්වා ඇත්තේ මූල්‍යකරන මුදල් ප්‍රවාහය වශයෙනි.

3.15 බැඳීම් සහ අසම්භව්‍යතාවන්

අසම්භව්‍යතාවන් යනු පසුගිය සිද්ධි හේතුවෙන් පැන නගින විය හැකි වත්කම් සහ බැඳීම් වන අතර ඒවා සනාථ කරන්නේ අධිකාරියේ පාලනයෙන් තොර කිසියම් අනාගත අවිනිශ්චිත සිදුවීමක් සිදු වූ හෝ සිදු නොවන විට දීය.

3.16 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

අසම්භව්‍යතාවන් යනු පසුගිය සිද්ධි හේතුවෙන් පැන නගින විය හැකි වත්කම් සහ බැඳීම් වන අතර ඒවා සනාථ කරන්නේ කිසියම් අනාගත අවිනිශ්චිත සිදුවීමක් සිදු වූ හෝ සිදු නොවන විට දීය. එය මුළුමනින්ම කණ්ඩායම පාලනයෙන් තොරවය.

3.17 වාර්ථා කරන දිනෙන් පසුව සිදුවීම්

වාර්ථා කරන දිනෙන් පසුව සිදුවූ සියලුම ප්‍රමාණවත් සිදුවීම් සැලකිල්ලට ගන්නා ලද අතර අදාල හෙදරව්වන් හෝ ගැලපීම් ඇති විට ඒවා මූල්‍ය ප්‍රකාශ වල සටහන් වල අඩංගු කොට ඇත්තේය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

2 දේපල පිරියත් සහ උපකරන

	ලිපිගොනු ගබඩාව	රසායනාගාර උපකරන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරන	පරිගණක උපකරන	පරිගණක මෘදුකාංග	එකතුව
පිරිවැය	රුපි	රුපි	රුපි	රුපි	රුපි	රුපි	රුපි
2016 ජනවාරි 1 වන දිනට ශේෂය	-	-	-	-	-	-	-
වර්ෂය තුල එකතු කිරීම්	-	-	716,784	2,025,270	3,177,965	-	5,920,019
2016 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	-	-	716,784	2,025,270	3,177,965	-	5,920,019
පෙර වර්ෂය සඳහා නිවරදි කිරීම්	-	-	152,326	78,921	9,213	-	240,460
2016 දෙසැම්බර් 31 වන දිනට යලි ප්‍රකාශිත ශේෂය	-	-	869,110	2,104,191	3,187178	-	6,160,479
2017 ජනවාරි 1 වන දිනට යලි ප්‍රකාශිත ශේෂය			869,110	2,104,191	3,187178		6,160,479
වර්ෂය තුල එකතු කිරීම්	15,257,976	6,247,840	240,258	384,104	848,175	224,400	23,202,232
2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**15,257,976**	**6,247,840**	**1,109,368**	**2,438,295**	**4,035,353**	**224,400**	**29,363,232**
සමිච්චිත ක්ෂය / ක්‍රම ක්ෂය	-	-		-	-	-	-
2016 ජනවාරි 1 වන දිනට ශේෂය	-	-		-	-	-	-
වර්ෂය තුල අය කිරීම්	-	-	31,449	154,693	204,905	-	391,047
2016 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	-	-	31,449	154,693	204,905	-	391,047
පෙර වර්ෂ සඳහා නිවරදි කිරීම්	-	-	31,022	67,697	190,587	-	289,306
2016 දෙසැම්බර් 31 වන දිනට යලි ප්‍රකාශිත ශේෂය	-	-	**62,471**	**222,390**	**395,492**	-	**680,353**
	-	-	-	-	-	-	-
2017 ජනවාරි 1 වන දිනට යලි ප්‍රකාශිත ශේෂය	-	-	62,471	222,390	395,492	-	680,353
වර්ෂය තුල අය කිරීම්	610,319	833,997	192,889	451,977	908,166	16,599	3,013,948
2017 **දෙසැම්බර් 31 වන දිනට ශේෂය**	**610,319**	**833,997**	**255,360**	**674,367**	**1,303,658**	**16,599**	**3,694,301**
	-	-	-	-	-	-	-
ඉදිරියට ගෙන යන අගය	-	-	-	-	-	-	-
2017 දෙසැම්බර් 31 වන දිනට	14,647,657	5,413,843	854,008	1,813,928	2,731,695	207,801	25,668,931
2016 දෙසැම්බර් 31 වන දිනට	-	-	685,335	1,870,577	2,973,060	-	5,528,972

වර්තමානයේදී අධිකාරිය විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි, රසායනාගාර උපකරන, වාහන සහ අනෙකුත් වත්කම් වැනි යටිතල පහසුකම් භාවිත කරන අතර අධිකාරිය විසින් තමන්ටම අයත් වත්කම් අත්පත් කර ගැනීමේ කාර්යයයේ යෙදී සිටී.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රුපි	රුපි
3	**තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දේ**		
	ඉන්ධන සඳහා තැන්පතු	50,000	50,000
	වෙනත් ලැබිය යුතු දේ	73,244	-
	ලැබිය යුතු ප්‍රධානයන්	--	21,067,000
	තැන්පතු සහ කලින් ගෙවීම් වල එකතුව	**123,244**	**21,117,000**
4	**මුදල් සහ මුදල් හා සමාන දේ**		
	මුදල් සහ මුදල් හා සමාන දේ	631,763,823	79,624,667
	මුදල් සහ මුදල් හා සමාන දේ වල එකතුව	**631,763,823**	**79,624,667**
5	**ප්‍රාග්ධන ප්‍රධානයන්**		
	ප්‍රාග්ධන ප්‍රධාන	5,528,972	5,920,019
	ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රම ක්ෂය	(1,342,902)	(391,047)
	ප්‍රාග්ධන ප්‍රධානයන්ගේ එකතුව	**4,186,070**	**5,528,972**
6	**විලම්බනය කල බදු වගකීම**		
	දේපල, පිරියත් සහ උපකරන වල ලියා හැරි අගය	25,668,931	5,528,972
	දේපල, පිරියත් සහ උපකරන බදු පදනම	19,078,474	4,577,117
	බදු කල හැකි තාවකාලික වෙනස	6,590,457	951,855
	28% බදු	1,845,328	2,66,519
	වර්ෂය අවසානයට විලම්භනය කල බදු වගකීම	**1,845,328**	**266,519**
	වර්ෂය ආරම්භයේදී විලම්භනය කල බදු වගකීම	266,519	-
	විලම්භනය කල බදු වෂයෙන් අය කල මුදල	**1,578,809**	**266,519**
7	**ලද අත්තිකාරම්**		
	කලින් ලත් ගාස්තු	85,643,656	14,360,429
	ලද අත්තිකාරම් වල එකතුව	**85,643,656**	14,360,429
8	**ගෙවිය යුතු වියදම් සහ වෙනත් ගෙවිය යුතු දේ**		
	ගෙවිය යුතු වියදම්	34,864,290	2,742,690
	වෙනත් ගෙවිය යුතු දේ	33,492,309	-
	රඳවා ගත් තැන්පතු	877,334	-
	සේ.අ.අරමුදල් දායක ගෙවිය යුතු	1,240,839	-
	සේ.හාර.අරමුදල් දායක ගෙවිය යුතු	185,659	-
	ගෙවිය යුතු වියදම් වල එකතුව	**70,660,430**	**2,742,690**
	දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා	2017	2016
9	**ආදායම්**		
	ඖෂධ සාම්පල බලපත්‍ර ආදායම්	9,504,018	2,342,000
	උපකරන සාම්පල බලපත්‍ර ආදායම්	9,856,683	2,154,000
	සාම්පල ආනයන බලපත්‍ර ආදායම්	40,249,464	11,456,000
	උපකරන ආනයන බලපත්‍ර ආදායම්	34,603,084	12,624,000
	රූපලාවන්‍ය ආලේපන ආනයන බලපත්‍ර ආදායම්	174,000	-
	ඖෂධ නිශ්පාදන බලපත්‍ර ආදායම්	1,835,960	280,000
	උපකරන නිශ්පාදන බලපත්‍ර ආදායම්	89,541	13,000
	මූලූ ආදායම් (ඉදිරියට ගෙන ගියා)	96,312,750	28,869,000

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රුපි	රුපි
0	ආදායම (තවදුරටත්)	96,312,750	28,869,000
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම	81,014,008	35,430,100
	උපකරන ලියාපදිංචි කිරීමේ ආදායම	58,340,687	8,042,100
	රූපලාවණ්‍ය ආලේපන ලියාපදිංචි කිරීමේ ආදායම	282,000	-
	රසායනාගාර පරීක්ෂාවන් සඳහා ගාස්තු	4,879,463	430,000
	ඖෂධ සකස් කිරීම් ගාස්තු	105,320,830	19,871,000
	උපකරන සකස් කිරීමේ ගාස්තු	54,552,305	1,636,000
	රූපලාවණ්‍ය ආලේපන සකස් කිරීම් ගාස්තු	67,500	-
	සීමාස්ථ සකස් කිරීමේ ගාස්තු	4,345,455	-
	සායන පරීක්ෂා සකස් කිරීම් ගාස්තු	970,440	-
	ප්‍රචාරන වියදම්	840,750	50,000
	සිල්ලර ඖෂධ අලෙවි සැල් බලපත්‍ර ගාස්තු	24,969,858	12,897,360
	තොග ඖෂධ අලෙවි සැල් බලපත්‍ර ගාස්තු	12,517,515	3,937,900
	ප්‍රවාහන ඖෂධ අලෙවි සැල් බලපත්‍ර ගාස්තු	9,871,387	3,247,1000
	ලියාපදිංචි කිරීමේ ගාස්තු නිදහස් කිරීමේ ආදායම්	2,775,717	-
	යහපත් නිශ්පාදන පුරුදු පරීක්ෂා කිරීම - දේශීය	356,906	-
	යහපත් නිශ්පාදන පුරුදු පරීක්ෂා කිරීම - විදේශීය	19,362,586	-
	WHO යහපත් නිශ්පාදන පුරුදු සහතිකය	93,174	-
	COPP සහතිකය	69,966	-
	අතිරේක ලිය කියවිලි ඉදිරිපත් කිරීම	70,182,326	-
	නියෝජ්‍යායතනය මාරු කිරීමේ ගාස්තු	7,299,840	0
	නිදහස් වෙළඳ සහතික ගාස්තු	69,938	0
		554,495,401	**114,410,560**
10	**ප්‍රධානයන්**		
	පුණරාවර්ථන ප්‍රධානයන්	-	49,796,981
			49,796,981
11	**පරිපාලන වියදම්**		
	ක්ෂය	3,013,948	391,047
	ජලය	395,075	358,474
	විදුලිය	8,414,052	9,312,335
	දුරකථන	762,958	610,703
	තැපැල් ගාස්තු	130,001	23,750
	ලිපි ද්‍රව්‍ය	1,390,922	180,782
	ගමන් ගාස්තු - දේශීය	22,511	96,122
	ගමන් ගාස්තු - විදේශීය	5,197,342	198,690
	සංවර්ධන සහ පුහුණු වියදම්	2,945,566	1,628,505
	රසායනාගාර වියදම්	1,238,256	-
	ඉන්ධන වියදම්	604,745	455,818
	ආරක්ෂක සේවා ගාස්තු	2,886,487	3,496,015
	ලියකියවිලි පරිහරන ගාස්තු	410,109	385,000
	ප්‍රකාශන සහ ප්‍රචාරන වියදම්	906,607	618,225
	පිරිසිදු කිරීමේ සේවා	4,222,837	4,539,462
	වාහන නඩත්තු	1,255,061	977,379
	රසායනාගාර උපකරන නඩත්තුව	3,579,161	314,650
	ගිනි නිවන උපකරන නඩත්තුව	49,037	42,831
	වායු සමන යන්ත්‍ර නඩත්තුව	1,521,271	255,258
	වකතුව ඉදිරියට ගෙන ගියා	**38,945,944**	**23,885,046**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රුපි	රුපි
11	**පරිපාලන වියදම්**	**38,945,944**	**23,885,046**
	ගොඩනැගිලි නඩත්තුව	724,468	488,573
	පරිගණක අයිතමයන් සහ වෙනත් අයිතමයන් නඩත්තුව	778,402	-
	යහපත් නිශ්පාදන පුරුදු සංචාර ගමන් සඳහා වියදම්	18,127,163	1,045,040
	සම්මන්ත්‍රණ ශාලාව වෙන් කරගැනීම	129,500	-
	සාංගමික සැලසුම් කෙටුම්පත් කිරීම	582,735	-
	වෙබ් අඩවිය නඩත්තුව	79,000	-
	රෙගුලාසි කෙටුම්පත් කිරීමේ වියදම්	23,840	-
	කුරියර් සේවා ගාස්තු	8,610	-
	වර්ජනම් සහ බදු	78,401	78,401
	විගණන ගාස්තු	1,281,178	-
	එකතුව	**60,759,242**	**25,497,060**
12	**වැටුප් සහ වේතන**		
	වැටුප් සහ වේතන	65,291,547	73,143,068
	වෙනත් දීමනා	6,131,029	1,504,701
	අතිකාල ගෙවීම්	6,378,649	3,589,378
	ද්විතීයන දීමනා	8,387,083	-
	විශ්‍රාම වැටුප් දායක මුදල්	8,383,083	157,113
	සේවක අර්ත සාධක අරමුදලට දායක මුදල්	856,729	-
	සේවක භාරකාර අරමුදලට දායක මුදල	178,798	-
	එකතුව	**95,610,919**	**1,198,671**
13	**වෙනත් වියදම්**		
	වෙනත් අලුත් වැඩියා සහ නඩත්තු	659,905	879,648
	සංග්‍රහ සහ වෙනත් වියදම්	195,213	255,402
	සැසඳීම් නොකල වියදම්	-	63,621
	එකතුව	**855,117**	**1,198,671**
14	**වර්ෂය සඳහා ආදායම් බදු**		
14.1	වර්ෂය සඳහා ආදායම් බදු	113,874,523	2,723,519
	වර්ෂය සඳහා විලම්භනය කල බදු වියදම්	1,578,809	266,519
	වර්ෂය සඳහා ආදායම් බදු	**115,453,332**	**2,990,038**
14.1	බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම	404,277,029	60,547,713
	එකතු කරන්න: ඉඩදිය නොහැකි වියදම්	3,209,160	710,070
	අඩු කරන්න: ඉඩ දිය හැකි වියදම්	(8,941,856)	(1,342,902)
	අඩු කරන්න: බදු අදාල නොවන ආදායම්	(1,342,902)	(50,188,028)
	වර්ෂය සඳහා ගලපන ලද ලාභය	**397,201,431**	**9,726,853**
	බදු ගෙවිය යුතු වෙනත් ලාභ සහ ආදායම්	-	-
	මුලු ව්‍යවස්ථාපිත ආදායම/බදු ගෙවිය යුතු ආදායම	397,201,431	9,723,853
	වර්ෂය සඳහා ආදායම් බදු 28% මත	111,216,401	2,723,519
	බදු බැර		
	ජාතික බද්ද	(65,397)	-
	වර්ෂය සඳහා ආදායම් බද්ද	111,151,004	2,723,519
	වර්ෂය සඳහා ගෙවිය යුතු මුලු ආදායම් බද්ද	**113,874,523**	**2,723,519**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
දෙසැම්බර් මස 31 වන දිනින් අවසන් වර්ෂය සඳහා

15 පෙර වර්ෂ සඳහා ගැලපීම්

පහත සඳහන් දේ නිවරදි කිරීම සඳහා පෙර වර්ෂ සඳහා ගැලපීම් කරන ලදී

උපචිත ආදායම්

හඳුනා නොගත් තෑගි වශයෙන් ලත් වත්කම්	289,306
හඳුනා නොගත් තෑගි වශයෙන් ලත් වත්කම් ක්ෂය	240,460
උපචිත ආදායම් සහ වියදම්	5,862,512
2016 සඳහා විගණන ගාස්තු සඳහා වෙන් කිරීම	1,285,298
ගලපන ලද මුදලේ එකතුව	7,196,656

16. ආසන්නම පාර්ශව ගණුදෙනු

ප්‍රධාන පෙලේ කළමණාකරන හානිපූර්ණයන්

අධිකාරියේ ප්‍රධාන පෙලේ කළමණාකරන කාර්ය මණ්ඩලයට අඩංගු වන්නේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධිකාරියේ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වේ

අධිකාරියේ ප්‍රධාන පෙලේ කළමණාකරන කාර්ය මණ්ඩලයට කාලපරිච්ඡේදය තුලදී ගෙවන ලද හානිපූරනයන් මෙසේය

	2017	2016
	රුපි	රුපි
කෙටිකාලීන සේවක සුභසාධනයන්	2,031,382	2,028,633
	2,031,382	2,028,633

17. වාර්තා කරන දිනයෙන් පසුව වූ සිදුවීම් මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීම් කිරීම අවශ්‍ය කෙරෙන හෝ හෙලිදරව් කිරීම අවශ්‍ය කෙරෙන ආකාරයේ කිසිදු ප්‍රමානවත් සිදුවීම් කිසිවක් වාර්තා කරන දිනෙන් පසුව සිදු වී නැත

18. **අසම්භව්‍ය වගකීම්**

වාර්තා කෙරෙන දිනට කිසිදු අසම්භව්‍යතාවක් හෝ කිසිදු බැඳීමක් හෝ නොපැවතින.

19. **නෛතික කටයුතු හෝ ඉල්ලීම්**

ඇපැල් උසාවියේ අධිකාරියට විරුද්ධව නඩු පහක් පවරා ඇත්තේය. එම නඩු අතර රුපියල් 497,700.00 ක වන්දියක් ඉල්ලමින් පවරන ලද අංක එච්සී(සිවිල්) 425/2017 එම් ආර් නමැති නඩුවක් පවතින අතර එහි තීන්දුව මෙතෙක් දී නැත. තවද පණතේ ප්‍රතිපාදන උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් නඩු දහ අටක් ගොනු කොට ඇත. තව දුරටත් කිවහොත් 2018 මාර්තු මස 22 දින වන විට ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ ප්‍රතිපාදන උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් දිවයින පුරා ආහාර සහ ඖෂධ පරීක්ෂක වරුන් විසින් පවරන ලද නඩු දහසයක් විභාග වෙමින් පවතී.

20. **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වගකීම්**

ශ්‍රී ලංකා ගණකාධිකරන ප්‍රමිතයන්ට අනුකූල වන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වගකිව යුතුවේ.

21. **මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශණයන් අනුමත කරන ලද අතර 2019 මාර්තු මස 22 වන දින ඒවා නිකුත් කිරීමට අනුමතිය දෙන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

යවම/ඒ/එන්එම්ආර්ඒ/
1/17/74

2018 ඔක්තෝබර් 1 වැනි දින

සභාපති,

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඔහුදෙනු
පිළිබඳ විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත

(ඩබ්ලිව්)

එච්.එම් ගාමිනී විජේසිංහ
විගණකාධිපති

පිටපත් :- 1 ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
2 ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 73
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எமது இல. / Our No. } එවිඑස්එම්/ඒ/එන්එම්ආර්ඒ/ 1/17/74

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 5 දින

සභාපති,
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 20 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර වක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

අධිකාරිය විසින් අවසන්වරට පිළියෙල කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

අයිතමය	වටිනාකම
	රු.
ජංගම නොවන වත්කම්	5,528,972
ජංගම වත්කම්	100,926,209
මුළු වත්කම්	106,455,181
ජංගම බැරකම්	43,102,015
ජංගම නොවන බැරකම්	5,795,491
මුළු බැරකම්	48,897,506
ශුද්ධ වත්කම් / හිමිකම්	57,557,67
	106,455,181

CHECKED
RE Division

මුළු ආදායම	165,246,657
මුළු වියදම	104,698,944
බදු පෙර අතිරික්තය	60,547,713
ආදායම් බදු	2,990,038
බදු පසු අතිරික්තය	57,557,675

2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු අයදුම්පත් ප්‍රමාණය, ලැබුණු දිනය, ඉන් ලියාපදිංචි කළ ප්‍රමාණය හා ලියාපදිංචි කළ දිනය ආදිය පිළිබඳ තොරතුරු, පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් සහිතව විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ කාර්යසාධනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කිරීමට නොහැකි විය.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත 105 වගන්තිය	සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධයෙන් අධිකාරිය විසින් සම්පූර්ණ හෝ තාවකාලික ලියාපදිංචියක් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර ලියාපදිංචිය සඳහා වූ කොන්දේසි නියම කරනු ලැබිය යුතු වුවද, විගණිත දිනය වූ 2018 අගෝස්තු 23 දින වන විටත් එම කොන්දේසි නියම කර නොතිබුණි.



(ආ)	2005 අංක 06 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත	යම් බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද ඒ බදු අයකළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දිනට පසු දිනයක් නොවන දිනයක දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වුවද, අධිකාරිය විසින් 2017 වර්ෂයට අදාළ එකතුකළ අගය මත බදු 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ගෙවා නොතිබුණි.
(ඇ)	2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත	සෑම වර්ෂයකම එක් එක් කාර්තුව අවසන්වී දින පහළොවක් ඇතුළත මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, අධිකාරිය විසින් 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ගෙවා නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(අ) මුදල් රෙගුලාසි 395 (ඇ)	බැංකු ගිණුම්වල එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙළ කළ යුතු වුවද, 2017 සැප්තැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනය 2018 අගෝස්තු 23 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි. ඒ අනුව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීමට අදාළව මාස 11 ක කාල ප්‍රමාදයක් පැවතුණි.
	(ආ) මුදල් රෙගුලාසි 454	සමාලෝචිත වර්ෂයේදී වාහන දෙකක් සඳහා මිලදී ගෙන තිබුණු ටයර් 08 ක් සඳහා භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් කර නොතිබුණු අතර බඩු වට්ටෝරු පොතක ඇතුළත් කරද නොතිබුණි.

CHECKED
RE Division

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	(iii)මුදල් රෙගුලාසි 757 – (2)	සමාලෝචිත වර්ෂයට අදාළව අධිකාරියේ බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණ වාර්තා 2018 සැප්තැම්බර් 21 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
(ඉ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා වේලා සටහන් යන්ත්‍ර භාවිතා කළ යුතු වුවද, 2014 මැයි 31 දිනෙන් පසු ක්‍රියාවිරහිතව පැවති ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට 2018 සැප්තැම්බර් 21 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.
(ඊ)	2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් සංස්ථාවේ ප්‍රගතිය පිළිබඳ නිසි සමාලෝචනයක් කළ නොහැකි විය.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ අංක 7 පරිච්ඡේදයෙහි 123 දරන වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් ගනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන අභියාචනා සලකා බැලීම සඳහා ස්ථාපිත කළ යුතු අභියාචනා කමිටුව 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

CHECKED
RE Division

(ආ) පනතේ 38 (2) (අ) හා (ආ) වගන්ති ප්‍රකාරව, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය 2015 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත පවරා ගත යුතු වුවද, විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් එම පර්යේෂණාගාරය අධිකාරිය වෙත පවරා ගෙන නොතිබුණි.

(ඇ) ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි (Waiver of registration) නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ III වන පරිච්ඡේදයේ IV වන කොටසේ අංක 58 හා IV වන පරිච්ඡේදයේ IV වන කොටසේ අංක 82 වගන්ති අනුව කිසිදු තැනැත්තෙකු විසින් යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර සහ අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතුය. එම පනතේ 59 හා 83 වගන්ති ප්‍රකාරව, ප්‍රත්‍යක්ෂ ආරක්ෂා සහිත සහ නිවැරදි තත්ත්වයේ ඖෂධ හෝ වෛද්‍ය උපකරණ ලබාදෙන බවට සහතික වීම සඳහා ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඖෂධ හෝ වෛද්‍ය උපකරණ ඇගැයීමෙන් පසුව ලියාපදිංචි සහතික හා බලපත්‍ර නිකුත් කිරීම අධිකාරිය විසින් සිදු කළ යුතුය. එසේ වුවද ඉහත සඳහන් විධිවිධානයන්ට පටහැනිව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා අනෙකුත් රජයේ හා පෞද්ගලික ආයතන වෙනුවෙන් 2017 වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 655 ක් 2018 ජනවාරි සිට 2018 ජූලි 10 දින දක්වා එවැනි ලිපි 256 ක් නිකුත්කර තිබුණි. පනත යටතේ ලියාපදිංචි නොකළ, බලය නොලත් ඖෂධ හා වෛද්‍ය උපකරණ ආනයනකරුවන්ට ඒවා ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගැනීම සඳහා එම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි භාවිතා කර තිබුණි.

(ii) ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම හේතුවෙන් ගුණාත්මය පිළිබඳ තහවුරුවක් නොමැති වෛද්‍ය සැපයීම් රට තුළට ගලා ඒම වැලැක්විය නොහැකි අතර, 2017 ජනවාරි සිට 2017 ජූනි 14 දින දක්වා ගාස්තුවක් අය කිරීමකින් තොරව එම ලිපි නිකුත් කර තිබුණු බැවින් එම කාලය තුළ අධිකාරියේ ලියාපදිංචි හා බලපත්‍ර ගාස්තු ආදායම අඩුවීමට හේතුවී තිබුණි. 2017 ජූනි 14 දින නිකුත්කර තිබුණු අති විශේෂ ගැසට් පත්‍රය මඟින් එම ලිපි නිකුත්කිරීමේදී එක්සත් ජනපද ඩොලර් 100 ක ගාස්තුවක් අයකළ යුතු බවට කොන්දේසි පනවා තිබුණු නමුත්

CHECKED
RE Division

අයකරගත් ගාස්තු ප්‍රමාණය පිළිබඳ විස්තර විගණික දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ VI වන පරිච්ඡේදයේ I වන කොටසේ අංක 109 වන වගන්තිය අනුව ජීවිතයක් බේරාගැනීම සඳහා හෝ බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීම සඳහා වැනි විශේෂ අවස්ථානුගත කරුණුවලදී හෝ වෙනත් යම් ජාතික අවශ්‍යතාවයක් සඳහා හෝ ජාතික ආරක්ෂාව සඳහා ඖෂධ, වෛද්‍ය උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදන නිශ්චිත ප්‍රමාණවලින් ආනයනය කිරීමට සහ සැපයීමට අධිකාරිය විසින් අවසරය ලබාදිය හැකිය. නමුත් ඉහත සඳහන් විශේෂිත අවශ්‍යතා ගණයට නොවැටෙන, අදාළ ඖෂධයේ හෝ වෛද්‍ය උපකරණයේ ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම හා ලියාපදිංචි සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් නොකිරීම වැනි හේතු මත සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 163 ක් වෛද්‍ය සැපයුම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. එවැනි හේතු මත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම, සැපයුම්කරුවන්ගේ ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචිය ලබාගැනීමට ඇති උනන්දුව ඕන කිරීමට හේතු වන බව නිරීක්ෂණය විය.

(ඉ) (iv) සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම 03 ක් සඳහා නැවත නැවතත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අවස්ථා 06 ක්ද 2018 ජූලි 10 දක්වා කාලය තුළදී එවැනි අවස්ථා 06 ක්ද පැවතුණි.

(ඇ) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් Efavirenz tablets 600 mg ඖෂධයෙන් පිරිවැය රු.483, 371 ක්වූ ඒකක 25,200 ක් හා පිරිවැය රු.249,831 ක් වූ ඒකක 12,600 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ සැපයුම්කරු අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණු හෙයින් 2017 ජනවාරි 09 දින හා 2017 සැප්තැම්බර් 18 දින අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 02 ක් නිකුත් කර තිබුණි. නමුත් මෙම ඖෂධය සඳහා 2016 සැප්තැම්බර් 24 දින සිට වර්ෂ 05 ක සම්පූර්ණ ලියාපදිංචිය ලබා සිටි සැපයුම්කරුවෙකු සිටියදී ඒ පිළිබඳව නොසලකා මෙම ඖෂධය සඳහා "ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැක" (There are no registered sources for this product) යන හේතුව සඳහන් කරමින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 02ඉදිරිපත් කර තිබුණි.

CHECKED
RE Division

3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 59 (2) වගන්තිය ප්‍රකාරව, යම් ඖෂධයක් නිෂ්පාදනය කිරීමට හෝ ආනයන කිරීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් එම ඖෂධය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම සමඟ එම ඖෂධයේ සාම්පල් ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නව ඖෂධ ලියාපදිංචිය වෙනුවෙන් ලැබී තිබුණු අයදුම්පත් 599 ක් අතරින් අයදුම්පත් 62 කට අදාළ සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි. නමුත් එම අයදුම්පත් 62 න් අයදුම්පත් 35 කට අදාළව සාම්පල් පරීක්ෂා කිරීමෙන් තොරව ලියාපදිංචි ලියාපදිංචි සහතික නිකුත්කර තිබුණි. තවද ඉතිරි අයදුම්පත් 27 ට අදාළ ලියාපදිංචි සහතික නිකුත් කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) රසායනාගාර අංශයේ දත්ත ගොනුවේ පරීක්ෂාවට භාජනය කරනු ලබන සාම්පල් වලට අදාල අයදුම්පත් සම්බන්ධ ලිපිගොනු අංකයට යොමුව (Dossier Number) ඇතුළත් කර නොතිබුණු බැවින් සාම්පල් පරීක්ෂා කිරීමේ ප්‍රගතිය පිළිබඳව නිවැරදි විශ්ලේෂණයක් කළ නොහැකි විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂා කිරීම සඳහා සාම්පල් 537 ක් ලැබී තිබුණු බැවින් හා සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාරය විසින් පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය 85 ක් පමණක් වූ බැවින් සාම්පල් පරීක්ෂා කිරීමේ ප්‍රගතිය සියයට 16 ක් පමණක් වූ බව නිරීක්ෂණය විය.

(iii) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 59 (4) (ආ) වගන්තිය ප්‍රකාරව, ඖෂධ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ලැබීමේදී අධිකාරිය විසින් එම ඉල්ලීම සමඟ ඖෂධයේ සාම්පල සහ සියලු විස්තර ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (එන්එම්කිව්ඒල්) වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, එම පර්යේෂණාගාරය

CHECKED
RE Division

වෙතින් සාම්පල් පරීක්ෂාව සිදු කර ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රථමයෙන්, ඖෂධ සඳහා තාවකාලික ලියාපදිංචි සහතිකයක් ලබා දී තිබුණු අවස්ථා 14ක් නිරීක්ෂණය විය.

(iv) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 60 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ඖෂධ ඇගැයීම් කමිටුව (එමඊසී) හා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (එන්එමකිව්ඒල්) විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සහ අනෙකුත් සියලු වෙනත් කරුණු සැලකිල්ලට ගනිමින් අධිකාරිය විසින් නිශ්චිත කාල සීමාවක් ඇතුළත එම ඖෂධය ලියාපදිංචි කරනු ලැබිය හැකි නමුත් එකම ඖෂධය ලියාපදිංචි කිරීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීමට සම්පූර්ණයෙන් එකිනෙකට වෙනස් කාල පරාසයන් ගත කර තිබුණු බව ඖෂධ අයදුම්පත් 47ක් පිළිබඳව පරීක්ෂා කිරීමේදී තහවුරු විය.

(ආ) 2017 ජනවාරි 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී කොළඹ, නිඹිරිගස්යාය, නුගේගොඩ, රත්මලාන හා දෙහිවල-ගල්කිස්ස යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ට අදාළ බල ප්‍රදේශයන්හි ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම හා ඔසුසල් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවට අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ලේඛණය අනුව එම බලප්‍රදේශ 05 හි එම කාලසීමාව තුළ ඔසුසල් 21ක් ලියාපදිංචි වී තිබුණද ඉන් ඔසුසල් 17 ක් සඳහා විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දින වන විටත් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ඔසුසල් බලපත්‍රය ලබාගෙන නොතිබුණු බව අධිකාරිය විසින් විගණනයට ලබාදුන් දත්ත ගොනුව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. තවද ඔසුසල් බලපත්‍ර නිකුත් කිරීමේදී අදාළ අයදුම්පත්‍රය ලබාගැනීමේ සිට බලපත්‍රය නිකුත් කිරීම දක්වා සියලු තොරතුරු ඇතුළත් කිරීම සඳහා විධිමත් දත්ත ගොනුවක් අධිකාරිය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

CHECKED
RE Division

(ii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 119(7) වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක සඳහන් කළ යුතු නියම හා කොන්දේසි සහ ඔසුසල ලියාපදිංචි කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳව අමාත්‍යවරයා විසින් නියෝග සකස් කොට ප්‍රකාශයට පත් කිරීම 2018 සැප්තැම්බර් 21 දින වන විටත් සිදු කර නොතිබුණි.

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ ඔසුසල් 49 කට අදාල ලිපිගොනු පරීක්ෂා කිරීමේදී 2017 වර්ෂයට අදාළව බලපත්‍ර අලුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණු ඔසුසල් 40 ක් පැවති බව නිරීක්ෂණය වූ අතර ඊට හේතු සොයා බලා බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ නම් එය වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් අධිකාරිය විසින් ස්ථාපිත කර නොතිබුණි.

(iv) 2017 දෙසැම්බර් මාසයේ සිට විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛන පරීක්ෂාවේදී බලපත්‍ර අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් නොකරන බවට නිරීක්ෂණය වූ අතර බලපත්‍රය ඉල්ලුම් කළ අයදුම්කරු විසින් අදාළ මුදල් ගෙවූ රිසිටපත අධිකාරිය වෙත භාරදීමේ සිට බලපත්‍රය නිකුත් කිරීම දක්වා ක්‍රියාත්මක වන ක්‍රියාවලියේ පවත්නා දුර්වලතා මීට හේතු වී තිබුණි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 232 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 122 ක් ද පුරප්පාඩු සේවක සංඛ්‍යාව 111 ක් ද විය. සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් 90 දෙනෙක් අධිකාරියේ සේවයේ යොදවා තිබුණු අතර මෙම නිලධාරීන් අතුරින් 34 දෙනෙක් සේවයේ යෙදවීම සඳහා 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව, අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩල තුළ ඇතුලත් විධායක නොවන තනතුරක් සඳහා විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකු හා අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුලත් නොවන යතුරු ලේඛක තනතුර සඳහා එක් නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර අධිකාරිය පිහිටුවා 2018 සැප්තැම්බර් 21 දින වන විට වර්ෂ 03 ඉක්මවා තිබුණද තනතුරු ස්ථිරව පිරවීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

CHECKED
RE DIVISION

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවයේ නියුක්තව සිටි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකු හා රසායනාගාර සහකාර නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් මුළු නිලධාරීන් 8 දෙනෙකු අධිකාරියේ සේවා නියුක්ත කාලය අවසන් වීම මත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත මුදා හැර තිබීම හේතුවෙන් විගණිත දිනය වූ 2018 අගෝස්තු 10 දින වන විට එම තනතුරු තවදුරටත් පුරප්පාඩුව පැවතුණි. තවද, සංවර්ධන නිලධාරී තනතුරට නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගැනීම සඳහා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරට එක් නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා 2017 අගෝස්තු 06 දින පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණද අදාළ බඳවා ගැනීම් පරිපාටියේ 5.4 ඡේදය ප්‍රකාරව ලිඛිත තරඟ විභාගයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අදාල නිලධාරීන් බඳවා ගැනීමට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටද අපොහොසත්වී තිබුණි.

(ඇ) 2016 ජූනි 12 දිනැති පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා තෝරා ගෙන තිබුණු නිලධාරියා විසින් 2016 නොවැම්බර් 24 දින එම තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු බැවින් නව නිලධාරියෙකු ස්ථිර වශයෙන් බඳවා ගැනීමට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණි.

(ඈ) පරිපාලන නිලධාරී තනතුරට එක් නිලධාරියෙකු සහ කළමනාකරණ සහකාර තනතුරට නිලධාරීන් 41 දෙනෙකු බඳවා ගැනීම සඳහා පිළිවෙළින් 2016 ජූනි 12 දින සහ 2016 නොවැම්බර් 22 දින පුවත්පත් දැන්වීම් පළ කර තිබුණි. එසේ වුවද 2018 සැප්තැම්බර් 21 දින වන විටද අදාල බඳවාගැනීම් සිදුකර නොතිබුණු අතර කළමනාකරණ සහකාර තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 19 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඉ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් වන සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණක, ඖෂධ විශ්ලේෂක, පිරිවැය නිලධාරී, ඖෂධ පරීක්ෂක සහ ඖෂධවේදී යන තනතුරු 06 සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කිරීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට 2018 සැප්තැම්බර් 21 දින වන විටත් අපොහොසත්වී තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවයේ නියුක්ත නිලධාරීන් 97දෙනෙක් සඳහා විධිමත් පරිදි රාජකාරි ලැයිස්තු ලබාදී නොතිබුණි.

CHECKED
RE Division

3.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අදාළව ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,351,167 ක් වූ අයිතම 6 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල යෝග්‍ය ආදර්ශකයක් භාවිතා කර නොතිබුණි.

(ඇ) ඉහත ප්‍රසම්පාදනයේදී පිරිවැය රු.182,850 ක් වූ වායු සමීකරණ යන්ත්‍රයක් සපයා ස්ථාපිත කර තිබුණද ඒ සඳහා ලංසු කැඳවීමේදී නඩත්තු හා සේවා කිරීම (Maintenance and Services) යන සේවාවන් ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුළත් නොකිරීම නිසා අදාළ සමාගම ඉදිරිපත් කරන ඕනෑම ගාස්තුවක් යටතේ නඩත්තු හා සේවා කිරීම ඉටුකර ගැනීමට අධිකාරියට සිදුවී තිබුණි. තවද මිලදී ගත් වායු සමීකරණ යන්ත්‍රය විගණිත දිනය වූ 2018 ජූලි 14 දින වන විටද ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ඉහත ප්‍රසම්පාදනයේදී පිරිවැය රු.670,000 ක් වූ ලැප්ටොප් පරිගණක 05 මිලදී ගැනීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඉ) ජාතික තරහකාරී ලංසු කැඳවීම අනුගමනය කරමින් පිරිවැය රු.13,972,626 ක් වූ සංවල රාක්ක පද්ධතියක් සහිත ලිපිගොනු ගබඩාවක් සැලසුම් කොට, සපයා, ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර පිරිවිතර සැකසීමේ අඩුපාඩු පැවතීම හේතුවෙන් රු.325,000 ක් වැයකර ඉදිකරන ලද කවාකාර තරප්පු පෙල වෙනුවට රු.275,000ක තරප්පු පෙළක් නැවත ඉදිකිරීමට සිදුවී තිබීම හේතුවෙන් රු.325,000 ක අනාර්ථික වියදමක් සිදුවී තිබුණි.



4. තිරසාර සංවර්ධනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු බව තහවුරු නොකෙරුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ආදායම ගිණුම්ගත කිරීම	ආදායම වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම.
(ආ)	ලියාපදිංචියෙන් නිදහස් කිරීම සඳහා ලිපි නිකුත් කිරීම	ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම අවම මට්ටමකින් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.
(ඇ)	කාර්ය මණ්ඩල බඳවාගැනීම	පනත ප්‍රකාරව කාර්ය මණ්ඩලය අනුයුක්ත කර නොතිබීම.
(ඈ)	ස්ථාවර වත්කම් පාලනය	අමාත්‍යාංශයෙන් ස්ථාවර වත්කම් පවරාගෙන නොතිබීම.
(ඉ)	ඔසුසල් බලපත්‍ර නිකුත්කිරීම	විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම.
(ඊ)	මූල්‍ය පාලනය	බැංකු සැසඳුම් නිසි පරිදි පිළියෙල නොකිරීම හා පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම.
(උ)	ප්‍රසම්පාදනය	ලංසු විවෘත කිරීමේ කමිටු පත් නොකිරීම් හා ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයක වාර්තා නොකිරීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

13

CHECKED
RE Division

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එච්එස්එම්/ඒ/එන්එම්ආර්ඒ/1/17/74 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2019 ඔක්තෝබර් 16 දින.

සභාපති,

ජාතික ඖෂධ නියාමන අධිකාරිය.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති.

පිටපත්:- 1. ලේකම්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එච්එස්එම්/ඒ/එන්එම්ආර්ඒ /1/17/74

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2019 ඔක්තෝබර් 16 දින.

සභාපති

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ හා 2018 ඔක්තෝබර් 15 දින අධිකාරියේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 නත්ත්වාගණනයකළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

(i) ප්‍රමිතයේ 113 ඡේදය ප්‍රකාරව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් ඉන්වෙන්ට්‍රි, කෙටිකාලීන ආයෝජන, ආදායම් බදු ප්‍රතිපාදනය, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු, ගෙවිය යුතු මුද්දර බදු, භාණ්ඩාගාර ප්‍රේෂණ සඳහා ප්‍රතිපාදන සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් පොලී ආදායම හා වෙනත් ආදායම් යන අයිතමයන් සඳහා සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 117 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීමට අවශ්‍ය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හෙළිදරව් කළ යුතු වුවද, අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (Related party transaction) පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

ප්‍රමිතයේ 31 ඡේදය ප්‍රකාරව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන ලැබී නොතිබීම පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රසායනාගාර පරීක්ෂණ ගාස්තු රු.2,913,051 ක් සහ බලපත්‍ර ගාස්තු රු.217,672 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම රු.3,078,000 කින් හා වෛද්‍ය උපකරණ පෙරසැරි ගාස්තු ආදායම රු.489,846 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද හා 2017 දෙසැම්බර් 31 දිනට බදු වගකීම රු.2,723,519 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු වටිනාකම රු.106,949,434 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.105,462,594 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට සහ සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවා තිබුණු මුද්දර ගාස්තු රු.31,201,280 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.36,111,233 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

වෛද්‍ය උපකරණ ආනයනය කිරීමේ ගාස්තු ආදායම් හා යහපත් නිෂ්පාදන පරිචය පරීක්ෂා කිරීමේ ගාස්තු (දේශීය) ආදායම්වල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් සහ උපලේඛන අනුව වටිනාකම් අතර පිළිවෙලින් රු.310,800 ක සහ රු.46,473 ක වෙනසක් පැවතුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අත්තිකාරම් ලැබීම් රු.85,643,656 ක වටිනාකම තහවුරු කරගැනීම සඳහා උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදී එම වටිනාකම තහවුරු කරගත නොහැකි විය.

2.2.5 වත්කම් ගිණුම්ගත නොවීම

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සතුව පැවති වත්කම් 2019 මැයි 31 දින වන විටත් ගිණුම්වලට ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.288,823,697 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.57,557,675 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.231,266,022 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලියාපදිංචි ආදායම සියයට 385 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 ප්‍රධාන ව්‍යදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පරිපාලන ව්‍යදම පිළිවෙලින් රු.25,497,060 ක් හා රු.60,759,242 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම ව්‍යදම සියයට 138 කින් වැඩිවී තිබුණි. එහි ඇතුළත් විදේශ ගමන් ව්‍යදම සියයට 2516 කින් වැඩිවී තිබීම සහ යහපත් නිෂ්පාදන පරිචය පරීක්ෂා කිරීමේ ව්‍යදම සියයට 1635 කින් වැඩිවී තිබීම ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

4 වෙනි පරිච්ඡේදය

කාර්යසාධනය සාක්ෂාත් කරගැනීමේ තිරසර සංවර්ධන අරමුණු (NMRA)

ජාත්‍යන්තර සංවර්ධනය ලොව පුරා ජීවත් වන මිනිසුන්ගේ අවශ්‍යතා සහ ලැදිකම් තුළින් ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි. සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රජාතන්ත්‍රවාදය, තිරසර බව සහ ආර්ථිකය වැනි ක්ෂේත්‍ර සමඟ වැඩි අවස්ථා සහිතව වඩාත් සාධාරණ ජීවිත ගත කිරීමට මිනිසුන් වඩාත් හොඳින් සූදානම්ව සිටිති. එක්සත් ජාතීන් සිය සංවර්ධන වැඩසටහන (UNDP) තුළින් "2030 වර්ෂය වන විට දුප්පත්කම අවසන් කිරීම, පෘථිවිය ආරක්ෂා කර ගැනීම සහ සියලුම මිනිසුන් සාමයෙන් සහ සමෘද්ධිමත්ව සතුටින් ජීවත්වීම" සහතික කිරීම පිණිස තිරසර සංවර්ධන අරමුණු (SDG) සමඟ වැඩ කරමින් කටයුතු කරයි. රටවල් සහ පාලන ප්‍රදේශ 170 කටත් අධික ගණනක දිළිඳු බව, ඒඩ්ස් (AIDS) කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව වෙනස්කම් කිරීම යන ප්‍රශ්න පිළිබඳව විසඳුම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී.

ඉලක්ක 17 න් 3 වෙනි ඉලක්කය වන්නේ මිනිසුන්ට සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමට ඔවුන්ගේ ෂීමනා සෞඛ්‍යය හා සුභසාධනය" සැලසීමට වගබලා ගැනීම ය. එමගින් ළමා මරණ නැති කොට මිනිසුන්ගේ අපේක්ෂා ඉහළ නැංවිය හැකි අතර එය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථයට ඉතාමත් සමීප ලෙස අදාල වේ.

ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සියලුම ක්‍රියාකාරකම් සකස් කරනු ලබන්නේ උපදෙස් දී ඇති පරිදි අංක 3 දරණ මෙම තිරසර සංවර්ධන අරමුණෙහි (SDG) ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ය.

3.8 සියලුම දෙනාට මූල්‍ය අවදානම් ආරක්ෂාව, ගුණාත්මක බවින් යුත් අත්‍යාවශ්‍ය සෞඛ්‍යාරක්ෂක සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව සහ සුරක්ෂිත, ඵලදායී, තත්ත්වයෙන් ඉහළ සහ දැරිය හැකි මිලක් සහිත අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් ලබා ගැනීමට ප්‍රවේශවීමේ හැකියාව ඇතුළුව විශ්ව සෞඛ්‍ය ආවරණයක් සාක්ෂාත් කර ගැනීම.

3.අ දුම්කොළ පාලනය සම්බන්ධ ලෝක සෞඛ්‍ය සංවිධාන සම්මේලනයේ වැඩරාමුව සියලුම රටවල යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.

3.ආ සංවර්ධනය වෙමින් පවතින රටවලට මූලිකවම බලපාන බෝවන සහ බෝනොවන රෝග සඳහා එන්නත් සහ ඖෂධ සම්බන්ධයෙන් සිදුකරනු ලබන පර්යේෂණ සහ වැඩිදියුණු කිරීම්වලට සහායවීම, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ සුනම්‍යතා සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන්වල වෙළඳ සම්බන්ධ අංග සහිත ගිවිසුමේ (Agreement on Trade Related Aspects of Intelleatual Property Rights) දැක්වෙන ප්‍රතිපාදන සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවට සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ අයිතිය සහතික කරනු ලබන TRIPS ගිවිසුම හා මහජන සෞඛ්‍යය

සම්බන්ධ දෝහා ප්‍රකාශනයට අනුකූලව දැරිය හැකි මිලකට ලබාගත හැකි අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත්වලට ප්‍රවේශය ලබාදීම සහ සියලුම දෙනා සඳහා ඖෂධවලට ප්‍රවේශය ලබාදීම.

3.ඇ සෞඛ්‍ය කටයුතු සඳහා මූල්‍ය දායකත්වය විභව ලෙස වැඩි කිරීම හා සංවර්ධනය වෙමින් පවතින රටවල විශේෂයෙන්ම අඩුවෙන්ම සංවර්ධනය වී ඇති රටවල සහ සංවර්ධනය වෙමින් පවතින තත්ත්වයේ සිටින කුඩා දූපත්වල සෞඛ්‍ය ශ්‍රමබලකාය බඳවා ගැනීම්, ඔවුන් සංවර්ධනය කිරීම, පුහුණු කිරීම, සහ රඳවා ගැනීම.

මෙම සියලුම ඉලක්ක ඖෂධ හා වෛද්‍ය උපකරණවල සුරක්ෂිත බව, ගුණාත්මක බව, සඵලත්වය හා මිල සම්බන්ධ කරුණු පෙරදැරි කරගෙන ඒවා නියාමනය කරමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථය තුලින් ඉටු කරනු ලබයි.

5 වෙනි පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

5.1 සේවක පිරිස කළමනාකරණය කිරීම

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ මට්ටම	34	12	22
තෘතීයික මට්ටම	6	-	06
ද්විතීයික මට්ටම	155	74	81
ප්‍රාථමික මට්ටම	50	34	16
එකතුව	**245**	**120**	**125**